# දූතයා

ආත්මික සඟරාව
67 වන කාණ්ඩය
2022 පළමු වන කලාපය



තවද දෙවියන්වහන්සේ
ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම්
ලෝකයාට ප්‍රේම කළසේක.
යොහාන් 3 : 16

ශ්‍රී ලංකා රෙපරමාදු සභාව මගින් ප්‍රකාශිතයි.

# පටුන

01. කතුවැකිය

02. බීජ වර්ග දෙකක දරුවන්ගේ ආගමනය

03. ශුද්ධාත්මයාණනී මුළු විශ්වයම අලුත් කළ මැනව

04. යේසුස් වහන්සේගේ කන්‍යා උපත හා ශුද්ධාත්මයාණන් වහන්සේ

05. තරුණ ඔබ සඳහාමයි

06. ළමා පිටුව

07. දෙවියන් වහන්සේ නොඉවසන්නාවූ කාරණා

08. දෙවියන් වහන්සේ, ස්වාධිපත්තිය හා පූර්ව නියමය

09. අපෝස්තුළුවරුන්ගේ ඇදහිලි ප්‍රකාශය

10. සභා පුවත්

**සංස්කාරක**
ගරු චමින්ද රත්නායක සභාපාලක තුමා

**කවරය හා පිටු සැකසුම**
නීලංග අබේසේකර


**පරිඝණක යතුරු ලියනය**
රෝහිනී පෙරේරා
ඩබ්ලිව්. පී. විශ්ව ශක්ති

**ප්‍රකාශනය**
ක්‍රිස්තියානි රෙපරමාදු සභාව
අංක 363, ගාලු පාර, කොළඹ 06.
දුරකථනය : 0112 360 861

නොමිලේ ඉගැන්වෙන තැපැල් මාර්ගීක බයිබල් පාඨමාලාව සහ පොත්, සඟරා ලබා ගැනීමට විමසන්න.
**සුබ අස්න බයිබල් විද්‍යාලය, අංක 363, ගාලු පාර, කොළඹ 06.**

ඔබගේ නිර්මාණ ( කවි, ලිපි, රචනා හා සාක්ෂි ) දූතයා සඟරාවෙහි පළ කිරීම සඳහා එවන්න.
**දූතයා කතෘ, අංක 363, ගාලු පාර, කොළඹ 06.**

# කතු වැකිය



## "පළවෙනි තැන ඔබ ජේසුට දුන්නොත් කවදාවත් ඔබ අන්තිම තැනට පත්වන්නේ නෑ"

අප තවත් වසරකට පා තබා සිටිමු. පසුගිය වසරේ ඔබගේ සියල්ලෙහිදී ප්‍රථම ස්ථානය දෙවියන්වහන්සේට ලබා දුන්නාද නැතහොත් වෙනත් ස්ථානයක් ලබා ගත්තාද යන පැනයට පිළිතුර ඔබටම බාර කරමි. එනමුත් **නව වසර ජයග්‍රාහී වසරක් බවට පත් කර ගැනීමේ අභිරහස** එළිදරව් කිරීමට කැමැත්තෙමි.

ඔබ දන්නවාද?.... ඔබ අදහන්නාවූ දෙවියන්වහන්සේ මුළු විශ්වයේම අල්ෆා සහ ඔමෙගා බවත් එනම්, ආරම්භය සහ අවසානය බවත්ය. මන්ද මෙය දෙවියන්වහන්සේ තමන්ව හඳුන්වා දෙන නාමයකි.

**"මම අල්ෆා සහ ඔමෙගා ද වෙමි. සිටින්නාවූ, සිටියාවූ, මතු සිටින්නාවූ සර්වපරාක්‍රම වූ, ස්වාමිවූ දෙවියන්වහන්සේ කියන සේක."** (එළිදරව් 1:8) මෙහි අර්ථය උන්වහන්සේ සියල්ලෙහි ප්‍රථමයා සහ අවසානය බව වේ. සියල්ලෙහි යන වචනේ අරුත සියල්ලෙහිම බව අප වචනාර්ථයෙන්ම විශ්වාස කල යුතු වේ. **අල්ෆා යන්නෙහි අරුත (First) ප්‍රථම, පළමුවෙනි සහ කිසිවිටෙකත් දෙවෙනි නොවන (නොදෙවෙනි) යන්න බවය.** එලෙසම දේව දරුවන් වන අප නව වසරේ අපගේ එදිනෙදා ජීවිතයේදී සියලුම ක්‍රියාවන් තුළින් එය සත්‍ය බව තහ වුරු කල යුතු වේ. ඊට කදිම අවස්ථාවක් නව වසර ආරම්භයේදීම උන්වහන්සේ ලබා දුන් සේක.

එනම් මෙම වසරේ පළමුවෙනි දින (සෙනසුරාදා) ඔබ දේව නමස්කාරයට සහභාගී වීම තුලින් සනාථ කලේ දෙවියන්වහන්සේ නව වසරේ ඔබගේ ජීවිතයේ ප්‍රථම ස්ථානය බවය. එලෙසම දෙවෙනි දින (ඉරිදා) එනම් පළමුවන සබත් දින දේවස්ථානයට සහභාගි වීම තුළින් සනාථ කලේ උන්වහන්සේ ඔබගේ සබත් දින ප්‍රථම ස්ථානය බවත් වේ. එලෙසම ඔබගේ දසයෙන් කොටස් වලද, පවුල් ජීවිතයේද, අධ්‍යාපනයේද මිල මුදල් වල සහ විනෝදාංශ වලද ප්‍රථම ස්ථානය උන්වහන්සේ බව තහවුරු කල යුතු වේ.

තවද ශු.බයිබලය පළමුවන වගන්තිය වන උත්පත්ති 1:1 දෙවිඳුන් අපට මුණ ගැසෙන්නේ **"පටන්ගැන්මේදී දෙවියන්වහන්සේ අහසත් පොළොවත් මැවූ සේක"** ලෙසය. එහි අන්තර්ගතය **මුළු විශ්වයේම පළමු ස්ථානය දෙවියන්වහන්සේ** බව මින් අපට පසක් කර දෙයි. එලෙසම යෙසායා 44:12 යන වගන්ති වලද උන්වහන්සේ නැවත නැවතත් තහවුරු කරන්නේ පළමු වෙනියා සහ අන්තිමයා තමන්වහන්සේ බව වේ.

එහෙයින් ඔබ අවංකවම සියල්ලෙහි ප්‍රථම ස්ථානය දෙවියන්වහන්සේට ලබා දෙන්නේ නම් ඔබට වෙනත් පුද්ගලයෙකුට හෝ දෙයකට ප්‍රථම ස්ථානය ලබා දිය නොහැකි වේ. මන්ද **උන්වහන්සේට අවශ්‍ය ඔබගේ ජීවිතයේ ප්‍රථම ස්ථානය මිස දෙවන හෝ වෙනත් ස්ථානයක් නොවේ.** එම නිසා අප අපගේ ජීවිතයෙන් ප්‍රථම ස්ථානය ලබා දිය යුතුය. **නොඑසේ නම් කිසිදු ස්ථානයක් ලබා නොදී සිටිය යුතු වේ.** මන්ද ඔබ ප්‍රථම ස්ථානය ලබා දෙන්නේ ඔබට විශේෂිත වූ පුද්ගලයන්ට පමණි.


එම නිසා මෙම වසර ඔබගේ ජීවිතය ජයග්‍රාහී නොව විජයග්‍රාහී වසරක් බවට පත්කර ගැනීමේ අභිරහස සේනාවල ස්වාමීන්වහන්සේ ඔබගේ සියල්ලෙහි ප්‍රථම ස්ථානය බවට පත්කර ගැනීම වේ.

**"එවිට උන්වහන්සේ තමන් දකුණත මා පිට තබා කියන සේක් භය නොවන්න !! මම පළමුවෙනියා සහ අන්තිමයාය."** (එළිදරව් 1:17)

2022 වසරේ දෙවියන්වහන්සේ ඔබගේ ජීවිතයේ සියල්ලෙහි ප්‍රථම ස්ථානය බවට පත්කර ගැනීමට **ඔබ උත්සාහ කරන්නෙහිද?**

**සියළු ගෞරවයද, මහිමයද හා ප්‍රශංසාවද දෙවිඳුන්ටම වේවා!**

ගරු චමින්ද රත්නායක සභාපාලක තුමා.



# බීජ වර්ග දෙකක දරුවන්ගේ ආගමනය



පාස්කු සමයේදී අප කථා කලයුතු දේවල් වලට අමතරව කිතුණුවෙක් ලෙස දැනගත යුතු බොහෝ දේවල් ඇත. ඒවා අතුරින් පරණ ගිවිසුමේ එන ආකාන්ගේ පාපය, නාබොත්ගේ මිදි වත්ත, නාමන්ගේ කුෂ්ඨ රෝගය ආදී කථා පුවත් වල සිදුවීම් සහ චරිතයන්ගේ එළිදරව් ඉතා වැදගත්ය. කායින් සහ ආබෙල්ගේ සිදුවීම .සහ ඉන් මතුවන පිළිසකරයන් පිළිබඳ කථා කිරීමට මම කැමැත්තෙමි.

මෙම සහෝදරයින් දෙපළගේ සරල සිදුවීම බයිබලයට එකතු කළේ එහි මහත් රහස් සමූහයක් මතුවට පැවත එන කිතුණුවාට, දැනගත යුතු බැවින්ය. කායින්ගේ සහ ආබෙල්ගේ ක්‍රියා දාමයන් තුළින් මතු වු සමාජ වටපිටාව, අදටත් වලංගුද, එම චරිත අපගේ ජිවිත වලට අදාළ කරගන්නේ නම් කිතුණුවාට යහපතක්ම සිදු වේ යැයි මම විශ්වාස කරමි.

ආදම් සහ ඒවගේ පුතුන් දෙදෙනා වන කායින් සහ ආබෙල් මානව ඉතිහාසයේ සිට විද්‍යාත්මකව බිහිවූ ප්‍රථම දරුවන් වන අතර එම දෙදෙනා සම්බන්ධ වු ප්‍රථම මිනී මැරුම ගිනස් පොතට එක් නොවුනද, කිතුණු ලෝකයට එය අමතක නොවේ.

උත්පත්ති 4 වන පරිච්ජේදයේ එන පරිදි කායින් ගොවියෙක් වී ආබෙල් බැටළු පාලකයෙකු ලෙස, ඔවුන් දෙදෙනා වෘත්තීන් දෙකක නියැලුණ බව සඳහන්ය. ආදම් සහ ඒව විසින් පාපය ලොවට බිහි කළත්, දෙවියන්වහන්සේගේ මහත් වූ කරුණාවෙන්, දිගු කලක් ජීවත් වීමට ඉඩ හැරිය සේක. කායින් සහ ආබෙල් නම් වු තම පුතුන් දෙදෙනාටත් පුජාවන් පිළිබඳ දැනුමක් ලබා දී ඇති බවට අපට සිතිය හැකිය.

කලකට පසුව ඔවුහු පූජාවක් ඔප්පු කළහ. වැඩිමහල් පුතාවු කායින් ගොවිපලින් උපයා ගත් දේත්, ආබෙල් එඩේර දිවියක් ගත කල බැවින් බැටළුවෙක් පුජාව සඳහා ඉදිරිපත් කළෝය. ඉතාම වැදගත් කරුණ වනුයේ උත්පත්ති 4:4-5 පදයට අනුව දෙවියන්වහන්සේ විසින් "ආබෙල් සහ ඔහුගේ පඩුර සැලකූ සේක. කායින් සහ ඔහුගේ පඩුර නොසැලකූ සේක." යනුවෙන් ලිය වී ඇති සිදුවීමයි. දෙවියන්වහන්සේ විසින් වැඩිමහල් සහෝදරයාගේ පඬුර පිළිනොගැනීමෙන් සහ බාල සහෝදරයාගේ පඬුර පිළිගැනීමෙන් විශාල ආරවුලකට මුලක් විය.

කායින්ගේ මෙම පුජාව ප්‍රතික්ෂේප වීමට හේතු වශයෙන් කිතුණුවෝ බොහෝ මත ඉදිරිපත් කරති. ඔහු කුණුවූ එළවළු පුජා කල බවත්, එය ප්‍රථම ඵලය නොවන බවත්, පෙන්වා දෙනු ලබන කරුණු අතර වේ. වැඩිමහල් සහෝදරයා පුජා කරන ලද දේ අගය කරමින්, හෙබ්‍රෙව් පොතේ සඳහන් ධර්මිෂ්ඨ ආබෙල් කායින් සමග සසඳමින් බාල සොහොයුරා පිළිබඳව වැරදි ප්‍රතිරූපයක් මවා ගෙන සිටිති. කෙසේ වෙතත් පුරාණ කාලයේ සිටම දෙවියන්වහන්සේට පුජා ඔප්පු කල බව මතෙව් 23:25 පදයෙන්ද තවදුරටත් සනාථ වේ. කිතුණුවාගේ කථාවට ලක්වන කායින්ගේ ප්‍රතිකෙෂ්පය පිළිබඳ කරුණ ඒ ආකාරයෙන්ම බයිබලයේ සඳහන් වී නොමැත.

කායින්ගේ චරිතයෙන් මතු වන ගති ලකෂණ කෙබඳුද? දෙවියන්වහන්සේ යහපත පමණක් මැවු අතර, මිනිසාගේ අකීකරුකමින් නපුර බිහි විය. එම නිසා ඔබත් මාත් නපුරාගෙන් ඉපිද ඇති ජීවියෝ වෙති. එහි පාලනය සාතන් මෙහෙයවයි. මේ වන විටත් උත්පත්ති 3:15 ප්‍රකාරයට "මම තා සහ ස්ත්‍රිය අතරෙහිද, තාගේ වංශය සහ ඇගේ වංශය අතරෙහිද, සතුරුකම තබන්නෙමි. ඒ වංශය තාගේ හිස පොඩි කරන්නෙහිය" යන දෙවියන්වහන්සේගේ සිතුවිල්ල නිසා ආත්ම ලෝකයක් සහ මාංශ ලෝකයක් නිර්මානය වී අවසන්ය. එනම් ආත්ම ලෝකයේ යහපත නියෝජනය කරනු ලබන්නේ දෙවියන්වහන්සේය. නපුර කරන්නේ සාතන්ය. මාංශ ලෝකය ලෙස මිනිසාගේ ක්‍රියාකාරකම් පෙන්වා දිය හැකිය.

මෙවැනි පසුබිමක් යටතේ කායින්ට කුමක් සිදුවීද? පඬුර පිළි නොගැනීම තුළ කායින් හිර වු අතර, දෙවියන්වහන්සේගේ දැක්මෙන් සිතීමට තරම් දැනුමක් ඔහුට නොතිබුණ. සහෝදරයා අතර ඇති වු කෝපය සාධාරණ බැව් කිතුණුවෝ ප්‍රකාශ කරති. කෙසේ වෙතත් සහෝදරයාගේ මරණය සහ දෙවිඳුන් සමග ඇති කරගත් වාග් ප්‍රහාරය අප සිහිකර ගත යුතුය. උත්පත්ති 4:9 " මම නොදනිමි. මම සහෝදරයාගේ රැකවලාද යි?" කායින් දෙවිඳුන්ට කීවේය.

වර්තමාන කිතුණුවාට මෙම සිදුවීම අභියෝගයකි. ආත්ම ලෝකයේ සතුරා සිටින බව නොදැන සිතුවිලි පරම්පරාවන්ට ඉඩ දෙමින් කිතුණු හරයත් සාකෂියත් බිඳ දමා ගන්නා කිතුණුවන් එමටය. දෙවියන්වහන්සේ කායින්ගේ පඬුර පිළි නොගත්තා මිස එය ප්‍රතිකෙෂ්ප කළේ නැත. එය තේරුම් ගැනීමට නොහැකි වු කායින් තම සහෝදරයා මැරීමට තරම් සිත දැඩිකරගත් බව බයිබලය කියයි.

අපගේ කිතුණු දිවිය අපි විපරම් කර බලමු. ඉතා ඉක්මනින් දැවී පිලිස්සී යන හදවත් දේව නමස්කාරය කරන කිතුණුවාට

උචිතද? නමස්කාරයට පෙරත්, පසුත් අප සතුටු විය යුත්තේ, දෙවියන්වහන්සේගේ ක්‍රියාවන් තුළ පමණය. වෛරය, ක්‍රෝධය හා මිනීමැරීම නමස්කාර දිවියට පටහැනිය. කායින් තුළ දෙවියන්වහන්සේගේ බීජය තිබුණා  නම් මෙවැනි දරුණු ක්‍රියාවන් බයිබලීය පුවත් වලට එකතු නොවේ. බීජය යනු කුමක්ද? ලූක් 8:11 බීජය වචනය බවත්, එම බීජය විවිධ වූ කෙත් හතරක පැල වන බවත් බයිබලයේ උපමාවක් ඇත. සාතන්ගේ බීජයෙන් ඉපදී ඇති අය කුණු වන බවත්, දෙවියන්වහන්සේගේ බීජය ඇති අය නැවත උත්පාදනයෙන් සරුවන බවත් 1 පේතෘස් 1:23 අනුව පෙන්වා දෙයි. දෙවියන්වහන්සේගෙන් ඉපිද සිටින කෙනෙක් පව් නොකරන බවත් 1 යොහන් 8 හි සඳහන් වේ.

නැවත උත්පාදනය වූ සරු බීජයක් කායින් තුළ නොතිබිණ. තම දෙමාපියන්ගෙන් ලබා ගත් ආත්මික ඇසුර සක්‍රිය නොවීය. **දෙවියන්වහන්සේ විසින් ආදම් සහ ඒවගෙන් අසන ලද පැන වලට ඔවුන් පිළිතුරු දුන්නත් කායින් කිසිම ප්‍රශ්ණයකට පිළිතුරු නොදී නිරුත්තර වීම දුෂ්ඨ ආත්ම වල ගති ලක්‍ෂණ වේ.**

මේවා පැමිණියේ කොහොමද? ඔහු තුළ නිවැරදි දේව බීජය නොවැටුණ බැවින් සාතන් ඔහුව භාජනයක් කර ගන්නා ලදී. දෙමව්පිය දෙදෙනාගෙන් ප්‍රමාණවත් ආත්මික ආහාරයන් නොලැබීම සාතන්ට කායින් ග්‍රහණය කරගැනීමට පහසු විය.

වර්තමාන කිතුණුවාටත් වචනය ප්‍රමාණවත් නොවන්නේ නම් ආත්මය කුණුවේ. කුණුවීම තුළ පසුබවටවීම, නොපනත්කම, මන්දගාමී වීම, අනිසි බිය, සැකය, ඇදහිල්ල හීනවීම වැනි දේවල් තිබෙන බැව් පෙන්වා දිය හැකිය. මෙවැනි නුසුදුසු මානසික විමෝචනයන් හමුවේ කිතුණු දිවිය අඩපණ වේ. කිතුණුවා තුළ තිබිය යුත්තේ එතුමා හොඳම මිතුරා බවට පත්කර ගැනීමට අවශ්‍ය ගති ලක්‍ෂණයන්ය. එනම් දත්තයන් එකිනෙකට කැපී යන සමගාමී සමීකරණයක් මෙනි. කායින් තුළ එකී උල්පත් නොතිබිණ. බයිබල් ඉතිහාසයට මෙම පුවත් එකතු කළේ හේතු සහිතවය.

අපි දැන් ආබෙල්ගේ චරිතය දෙස බලමු. උත්පත්ති 4 වන පරිච්ඡේදයේ ආබෙල් ගැන සඳහන් වන්නේ ඔහු එඬේරෙකු බවත් උත්පත්ති 4:4 ට අනුව පූජාව සඳහා තර බැටළුවෙකු පූජා කළ බවත් සහ ප්‍රථමයෙන්ම මරණයට යටත් වූ පුද්ගලයාත් ලෙසිනි.

හෙබ්‍රෙව් 11:4 අනුව ආබෙල්ගේ  පූජාව උතුම් පූජාවක් බවත් ධර්මිෂ්ඨ ආබෙල් කියා ද සඳහන් වේ. ශතවර්ෂ ගණනාවකට පසුත් ආබෙල් ගැන මෙවැනිම නිර්වචනයක් සැපයීමට ශුද්ධාත්මයාණන් වහන්සේ සමත් වූයේ ඇයි?

මෙම කථාව කෙරෙහි දෙවියන්වහන්සේගේ අනුග්‍රහය නොඅඩුවම ලැබී ඇත. ඊට ප්‍රථම අපි උත්පත්ති 3:21 ට යමු. "ආදම් ඒව සම් වලින් ඇන්ද වූ සේක'' යයි ලියා තිබේ. පාපය කළ නිසා නිරුවත හැඳින ගත් මෙම ප්‍රථම යුවල අත්තික්කා කොළ අතු වලින් ඇඳුම් නිර්මාණය කළද, පාපය නැසීමට දෙවියන්වහන්සේට අවශ්‍ය වූයේ රුධිරයයි. එම නිසා සතෙකු මරා එම සම පාපයේ වැස්මක් ලෙස ආදම් සහ ඒව ට පාවිච්චි කිරීමට කටයුතු කළ සේක. මෙහි ආත්මික අර්ථය කිමෙක්ද? ආරම්භයේ සිටම බැටළු පැටවෙකු සූදානම් කර ඇති බව එළිදරව් පොතේ සඳහන් කර ඇත. පරණ ගිවිසුමේ බොහෝ ක්‍රියාවන් අලුත් ගිවිසුමේ අඩයාලමක් ලෙස පවතී. එසේ දෙවියන්වහන්සේ ආබෙල්ව තෝරා ගෙන ආබෙල්ගේ හදවත ඊට සුදුසු පූජාවක් පෙන්වා දුන් සේක. සර්වඥාණ දෙවියන්වහන්සේ ආබෙල්ගේ හදවත දැනගත්තා විය හැකිය. දෙවියන්වහන්සේගේ බීජය වන වචනය ආබෙල් තුළ තිබෙන්ට ඇත. පූජාවක ඇති අගය වටිනාකම දරුවන් දෙදෙනාටම පෙන්වා දී තිබෙන්නට ඇත.

**5 වෙනි පිටුවට..**





# ශුද්ධාත්මයාණනි, මුළු විශ්වය අලුත් කළ මැනව

**ජගත් කිතුණු සාසනික සම්මේලනයේ සත්වැනි සැසිවාරය, 1991 පෙබරවාරි මාසයේ ඔස්ට්‍රේලියාවේ කැන්බරා නගරයේදී පැවැත්විණි. එම සැසිවාරයේ තේමාව වූයේ ශුද්ධාත්මයාණනි වඩිනු මැන මුළු විශ්වය අලුත් කළ මැනව යන්නයි.**

විශ්වයේ වැඩවසන සදාකාලික දෙවියන්වහන්සේ ත්‍රී එක වනසේක. පියාණන්වහන්සේ පුත්‍රයාණන්වහන්සේ හා ශුද්ධාත්මයාණන්වහන්සේ වන එකම දෙවියන්වහන්සේය. ශුද්ධාත්මයාණන්වහන්සේ වූ දෙවියන්වහන්සේ විශ්වය පුරා පවිත්‍රත්වය ගෙනෙන පිණිස ක්‍රියාකරන සේක. අදහන්නන්ගේ හදවත් පවිත්‍ර කරන්නේද ශුද්ධාත්මයාණන්වහන්සේය.

"සුදත් සමිඳුනි, සුළඟ මෙන් පැමිණ අප පවිත්‍ර කළ මැනව, පිවිතුරු සිත් අපට දුන මැනව, ගිනි මෙන් පැමිණ අප හදවත් තුළ තිබෙන අපවිත්‍ර දේ දවාලුව මැනව, පවින් අප මුදාගත මැනව, පිනිමෙන් පැමිණ අප හදවත් සනසා සිසිල් කළ මැනව, අපගේ වැරදි අපට පෙන්වා දුන මැනව, අඳුරින් ආලෝකයට අප ගෙන ආ මැනව, අපගේ හදවත් හා ජීවිතය යහපතට යොමු කළ මැනව, විශ්වයේ තෙදවත් බවටත්, ගුණවත් බවටත් අප උපයෝගී කර ගත මැනව" යයි අපට ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් අයැදීමට හැකිය.

වත්මන් ලෝකය දෙස අවධානය යොමු කිරීමේදී එය භේදයෙන්ද, වෛරයෙන්ද, ගැටුම් හා රෝගයෙන් පිරී තිබෙන බව නොරහසකි. නුමුත් ඒ සියල්ල අතරතුර දෙවියන්වහන්සේගේ ක්‍රියාව හා බලය ගැන කිතුණුවන්ගේ ඒකායන නොමියෙන බලාපොරොත්තුවක් ඇත. අලුත් අහසක් හා පොළොවක් උන්වහන්සේ විසින් මවන බවත්, එම ලෝකයේදී ඔවුන් සොම්නසින් ප්‍රීති නාද පැවැත්වීමට යන බවත්, එහි හැඬීමේ හෝ වේදනාවේ ශබ්දයක් නෑසෙන බවත් ඔවුහු දනිති. (යෙසායා 65:17,18) තවද එම ලෝකයේ සියලු දෙනා එකිනෙකා අතර සහයෝගයෙන් හා ප්‍රේමයෙන් ජීවත්වන බවද දේව වචනය පෙන්වා දෙයි.

ශුද්ධාත්මයාණන්වහන්සේ යනු යේසුස්වහන්සේගේ ආත්මය වන සේක. උන්වහන්සේගේ සෙනඟ අතර සියළු අපවිත්‍රකම් නැතිකොට එකිනෙකා අතර ආදරයෙන් හා කරුණාවෙන් ජීවිත්වීමට උපකාර කරන්නේ ආත්මයාණන්වහන්සේය. සභා ඉතිහාසය දෙස බැලූ විට කිතුණුවන් නිතරම ආත්මයාණන් වහන්සේගේ බලය ඉල්ලා යැදීම නිතර කළ යුතුය. එදා මෙන් අදත් කිතුණුවන් ආත්මයාණන් වහන්සේගෙන් ලබන ආශිර්වාද මුළු විශ්වයේ විසිර සිටින මනුෂ්‍ය සංහතියටම ආශිර්වාදයක් විය හැක.

ශුද්ධ බයිබලයේ එළිදරව් 21 වන පරිච්ඡේදයේද දෙවියන්වහන්සේ විසින් පොළොව පවිත්‍ර කරන ආකාරය පෙන්වා දෙයි. ශුද්ධාත්මයාණන්වහන්සේ මෙම අලුත් කිරීමේ ක්‍රියාව සිදුකරන සේක. ආත්මයාණන්වහන්සේ විසින් මුළු මැවිල්ල දිනක කිසිදු අඩුවක් නොමැති පවිත්‍ර තත්වයකට පමුණුවන බව ඉන් පැහැදිලිය. ලොව මැවීමේ ආරම්භයේ තිබූ ඒ යහපත් ස්වභාවයට නැවත මෙම පොළොව පැමිණීමට නියමිතය.

අසාධාරණය, සූරා කෑම, හොරකම, බොරුව, වංචාව, මංකොල්ල කෑම, අවනීතිය යන මේ සියලු අපවිත්‍ර දෑ නැතිකොට නවතම විශ්වයක් මැවීම දෙවියන්වහන්සේගේ අභිප්‍රායයි. මෙය සදාකාලිකව පවතින නවීකරණයකි. දෙවියන්වහන්සේට විරුද්ධවූ මනුෂ්‍යයාගේ සියළු අවනීති නැතිකොට දමා දෙවියන්වහන්සේ සුපිරිසිදු නව තත්වයක් ලෝකයට ලබා දීමට නියමිතය.

නත්තලෙහි සැබෑ අර්ථය නම් මැවුම්කාර දෙවියන්වහන්සේ මාංසවත් වී යේසුස්වහන්සේ ලෙස මෙලොවට පැමිණීමය. ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොටගෙන පිළිසිඳ ගත් උන්වහන්සේ ගවලෙනක් තුල මෙලොව උපත ලැබුවේ මනුෂ්‍යයාගේ අභ්‍යන්තර පාපය නැති කොට ජීවිතයට සැබෑ අර්ථයක් එකතු කිරීමටය. පාපයෙන් වෙන්වී දෙවියන්වහන්සේ වෙත පැමිණ ප්‍රේමයෙන් ජීවත් විය යුතු බව යේසුස්වහන්සේ ලබා දුන් පරමාදර්ශය විය. නත්තල් සමයට පැමිණෙන විට අප විසින්ද කළ යුත්තේ ශුද්ධාත්මයාණන්වහන්සේ තුල යේසුස්වහන්සේව ආත්මයෙන් බැහැ දැකීමය. පරණ ජීවිතය හා පරණ පව් ඉවතලා ආත්මයාණන්වහන්සේගෙන් උපත ලබා, සාමය හා ප්‍රීතියේ උපත වන යේසුස්වහමන්සේ අභියසට ලංවීම අපගේ ආශාව කරගමු.

අසූව දශකයේ අග භාගයේදී ඩැනියෙල් ජයමහ නමැති ජ්‍යෙෂ්ඨ කවියකුගේ අතින් පබැඳි මෙම කවිය ඉරිදා සිළුමෙණෙහි පළ වී තිබුණි.

ඉස්-කෝ මානයෙන් දය ගිනි ගැනෙන විට
සතපා නිවා ගෙනදී අස් වැසූම මට
සාමය සුසිත් දනියන් වෙත තිළිණ කොට
ඔබ ලෝ දිනූ සිරි සුබ නත්තලය පොට

සිව් ජාතියක සමගිය අත්වැලට යෙදී
මව් කුස උපන් දරුවන් මෙන් විසූව බැඳී
උදා අප ඇණ කොට ගන්නා විටදී බෙදී
වඳ පී යා හැකිය බොහො අය රටට ලැදී

සමගිය අවිය කොට ගනිමින් ඉවසීමේ
කොඩියේ සෙවණ යට සතුරන් මැඩලීමේ
සව්බල දෙවා අප හට සමිඳුනි සාමේ
යොමු කළ මැනවි කෙම් බිම වෙත සැනසීමේ

ඔබ සැමට අශිර්වාද ලත් වසරක් වේවා.

---

ගරු සිරිමල් ජයලත් ද සිල්වා පියනම



# 3 වෙනි පිටුවෙන්..

එම නිසාම අබෙල්ට ස්වකීය ධර්මිෂ්ඨකමට වඩා දෙවියන්වහන්සේ ලබා දුන් දැහැමිකම ආරෝපනය විය. ආබ්‍රහම්ද කීකරු කමින් දෙවියන්වහන්සේගෙන් ධර්මිෂ්ඨකම ලබා ගත්තේය. දෙවියන්වහන්සේට අවශ්‍ය දේ පූජා කිරීමටත් ආබෙල් ධර්මිෂ්ඨයෙක් විය. හෙබ්‍රෙව් 11:4 ආබෙල් කායින්ට වඩා උතුම් පූජාවක් දෙවියන්වහන්සේට ඔප්පු කළේය. ඔහු ධර්මිෂ්ඨයෙකු ලෙස සාක්ෂි ලැබුවේය.

එම පූජාව දෙවියන්වහන්සේට අවශ්‍යයම පූජාවක් විය. දෙවියන්වහන්සේ විසින් මනුෂ්‍යයාගෙන් ඉල්ලනු ලබන්නේ තැලුණාවූ බිඳුණාවූ සිත පමණි. යාන-වාහන, මිල-මුදල්, හරකා-බාන, ගෙවල්-දොරවල් යන යුගල පද වලින් කියවෙන භෞතික ආශිර්වාද එතුමන් මිනිසාට ලබා දෙන ඒවා මිස එතුමන්ට අවශ්‍ය දේවල් නොවන්නේය. වර්තමාන කිතුණුවා දෙවි අභිමුඛය තුළ යටහත්ව හදවත වගුරන්නේ නම් එය ආබෙල්ගේ පූජාවට සමාන වන්නේය. අද අප අතින් එය සිදුවන්නේද? ගීතාවලිය 116:6 හි යටහතුන් ආරක්‍ෂා කර ගලවන බව සඳහන් කර ඇත. ආබෙල්ගේ චරිතය මා හැඟි ප්‍රමෝදයකි.

යේසුස්වහන්සේද ආබෙල්ගේ පූජාව ගැන ලූක් 11:50-51, මතෙව් 23:25 යන පද වලින් සඳහන් කර තිබේ. මෙහි වේදසාක්ෂි මරණ ලෙස ආබෙල්ගෙන් පටන් 2 වංශාවලිය 24:20-22 සඳහන් සෙකරියාගේ මරණය දක්වා ලේ වල වන්දිය දඬුවමක් ලෙස පෙන්වා දෙයි. එය මතු පරම්පරාවට ශාපයක් වන බවද අනතුරු හඟවා පරම්පරාවන්ගෙන් අය කරන බවද සඳහන් කරයි.

මෙම ව්‍යවස්ථා නීතිය මිනිසාට දරා ගැනීමට නොහැකිය. එම නිසාම බැටළු පැටවා වූ යේසුස් වහන්සේ පූජා වූ බව පාවුල් තුමා හෙබ්‍රෙව් 12:24 පදයෙන් ඉතා අනර්ඝ ලෙස පෙන්වා දෙයි. එනම් අලුත් ගිවිසුමේ මැදහත්කාර වූ යේසුස් වහන්සේද, ආබෙල්ට වඩා උතුම් ලෙස කථා කරයි. ආබෙල්ගේ කාලය ඔහු සඳහා පමණක් වූ අතර යේසුස් වහන්සේගේ ලෙය මානව වර්ගයා වෙනුවෙන් විය. ආබෙල්ගේ ලෙය නිසා පොළොව විසින් ඉල්ලන ශාපය යේසුස් වහන්සේගේ ඉසීමේ ලෙයට හිලව් වේ. විශ්වාස කරන කිතුණුවන්ට කුමන ආශිර්වාදයක්ද?

එසේ නම් කිතුණුවා කළ යුත්තේ කුමක්ද? දේව අභිමුඛය යම් තැනකද, එතැනදී අපට මිදීමේ කල්වරි ලේ ගැන හදවතින් හෝ සාක්ෂි දැරිය හැකිය. ත්‍රිත්ව දෙවිඳුන් වැඩ වාසය කරන දේව මාළිගය අප හද අභ්‍යන්තරය බැවින් එතුමා අප නිසා ස්වර්ගය සොලවයි. පොළොවද සෙලවේ. මෙම සංකල්පනාව බීජය දරන අප තුළ පැවතිය යුතුවේ.

අලුත් ගිවිසුමේ යහපත් එඬේරා යේසුස් වහන්සේය. යහපත් එඬේරා අප වෙනුවෙන් ලේ වගුරුවන ලදී. ලේ සෙලවීම පිටුපස එතුමාගේ යුදෙව් සහෝදර පිරිස ප්‍රමුඛ විය. ආබෙල්ටද ප්‍රිය මනාප පූජාවක් නිසා සහෝදරයෙකු අතින් ලෙය සොලයන්ට සිදු විය. මුල සිට දෙවියන්වහන්සේ ආබෙල්ගේ පසුබිම දන්නා බැවින් ධර්මිෂ්ඨයෙක් ලෙස සම්මත විය.

කිතුණුවාට බොහෝ අවස්ථාවන් හිදී මෙවැනි අභියෝග හමු වේ. එහි පිටුපස අපේ වැඩිමහල් සහෝදරයා වන යේසු තුමන් සිටිනා බැවින් විශාල කඳු කුඩා කඳු බවට පරිවර්තනය කළ හැකි වේ. අලුත් ගිවිසුමේදී කිතුණුවා මෝසෙස්ගේ ව්‍යවස්ථාවෙන් නිදහස්ය.

අප දැන් මෙම කථා පුවතේ සමාජ මෙහෙවර ගැන සොයමු. කුමන හෝ ක්‍රම වේදයකින් දෙවියන්වහන්සේ සමඟ සෘජුව කථා කරන පරණ ගිවිසුමේ මුල් යුගයේ සෙනඟක් ජීවත් වුහ. ඒ අය අතරින් සාතන්ගේ වචන දරණ සෙනඟක් සහ දෙවියන්වහන්සේගේ වචන දරණ සුළු පිරිසක් සිටි බව පෙනේ. උදාහරණයක් ලෙස ආබෙල් දෙවියන්වහන්සේගේ දරුවන් නියෝජනය කරන අතර කායින් සාතන්ගේ පෙළපත නියෝජනය කරන්නෙක් වේ. මෙම භේදය ආත්ම ලෝකයේ සිදු වුවද ක්‍රියාත්මක වනුයේ මාංශ ලෝකය තුළය. සාතන්ගේ පාලනය එවකට අධිකව තිබුණ බැවින් එය පාලනය කිරීම සඳහා ව්‍යවස්ථාවක් පවා දෙවියන්වහන්සේ විසින් මෝසෙස් හරහා පනවන ලදී. වර්ෂ ගණනාවක් පසු කළත් මෙම වර්ග දෙකක දරුවන්ගේ පැවැත්ම ඒ ආකාරයෙන්ම පැවතුණි. යේසුස් වහන්සේගේ ප්‍රථම පැමිණීම සිදුවන අවධියේදී මෙම භේදය ඉතා උග්‍රව පැවතුණි. සාතන්ගේ බීජය ඇති පරිසිවරුන්, ලියන්නන්, සද්දිසිවරුන් ඇතුළු බොහෝ යුදෙව්වෝ වචනය නිවැරදිව දැන ගෙන නොසිටියෝය. **ඔවුන්ට පංච පුස්තකය කට පාඩමිය. නමුත් මෙසියස්වහන්සේ දෙවියන්වහන්සේ බව නොදත්හ.** යොහාන් 8:35-45 දක්වා සඳහන් පද වලින් ඔවුන්ගේ අඥාණකම පැහැදිලිය. "අපේ පියාණෝ ආබ්‍රහම්ය, ඔබ ආබ්‍රහම්ගේ දරුවෝ නම් ආබ්‍රහම් කළ ක්‍රියා කරනු ඇත. එසේ වුවත් දෙවියන්වහන්සේගෙන් අසා දැනගත් සත්‍ය ප්‍රකාශ කළ මිනිසෙකු වන මා මරන්ට ඔබ සොයන්නහුය." ආබ්‍රහම් නම් එසේ කළේ නැත. ඊට පසු යේසුස්වහන්සේ "දෙවියන්වහන්සේ ඔබගේ පියාණෝ නම් ඔබට ප්‍රේම කරනු ඇත. මන්ද මම දෙවියන්වහන්සේගෙන් පහල වී දැන් මම මෙහි සිටිමි."

යේසුස් වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා යයි කී පමණින්ම සාතන්ගේ බීජය දරණ මෙම යුදෙව්වෝ දෙවියන්වහන්සේගේ බීජය දරණ ගෝලයන්ට සිනගෝග වලදී පවා වද හිංසා කළෝය. අනාගතවක්තෘන් විසින් ප්‍රකාශිත දේවල් මෙකී සෙනඟ නොතැකුහ. මෙසියස් වනාහි දැවැන්ත දේශපාලන නායකයෙක් බව සිතමින් දෙවියන්වහන්සේ විසින් එවන ලද සැබෑ මෙසියස්ට වද හිංසා කළෝය. මුල් සියවසේ ප්‍රාථමික සමාජයේ තිබුණ මෙහෙවර මීට වසර 2000 ට පෙර තිබුණ සමාජයෙත් පැවතුණි. එම නිසාම කායින් ආබෙල්ව යටපත් කරන ලදී යන සමීකරනයට අනුගත වු සමාජයක් නිර්මානය වී තිබුණ බව ක්‍රියා 7 51-53 දක්වා පැහැදිලි වේ.

**"තද කුලල් ඇත්තෙනි, සිතින් කන් වලින් අචර්මච්ඡේදිතයෙනි, නුඹලාගේ පියවරුන් කළාක් මෙන් නුඹලාත් කරන්නාහුය. නුඹලාගේ පියවරුන් පීඩා නොකලේ ප්‍රෝපේතවරුන්ගේ කොයි තැනැත්තාටද? නුඹලා ධර්මිෂ්ඨයාණන්ගේ ඊම පළමුවෙන් දැන්වුවත් මැරුවෝය"** යි සඳහන්ය.


දේව බීජය ඇති අය සහ සාතන්ගේ බීජය ඇති අය සමඟ වු දඹරය එදා මෙන්ම අද සමාජය තුළද පෙන්නුම් කරයි. මේ පිළිබඳව යේසුස්වහන්සේ මතෙව් 13:37-39 හි තිරිඟු සහ කිරිඳි උපමාවෙන් පෙන්වා දී ඇත. බීජ වර්ග දෙකකින් උපන් වර්ග දෙකක දරුවන් සිටින බව පෙන්වා දෙයි. මෙම බීජය වපුරා ඇත්තේ අවුරුදු 2000 කලින් වුවද මෙම බීජ වලින් නිර්මානය වු වර්ග දෙකේ දරුවන් පිළිබඳව අදටත් පැහැදිලිව පෙනේ. කායින් නිරූපනය කරන බීජය ඉරිඟු වන අතර ආබෙල් නිරූපනය කරන බීජය තිරිඟු වේ. යේසුස් වහන්සේ මෙම වර්ග දෙකම එකට වැඩීමට ඉඩ හරින ලෙස එම උපමාවෙන් පෙන්වා දී ඇත. ඉරිඟු ගින්නෙන් දැවී යන බවට අනතුරු හඟවයි.

බොරු ප්‍රොපේතවරුන් බහුලව ඇති වර්තමාන සමාජයට මෙම උපමාව ඉතාම උචිතය. දේශණාකාරයා 5:1 ට අනුව "නුඹ දෙවියන්වහන්සේගේ ගෘහයට යන විට නුඹේ පාද බලාගන්න. අඥාණයින්මෙන් පූජා ඔප්පු කිරීමට වඩා අසන්ට ලංවීම හොඳය. නමුත් නපුර කරන බව ඔවුහු නොදනිති."

අදටත් ඇතැම් දේව ගෘහයන්හි හාස්කම් වලටම මුල් තැන දෙමින්, දේව අභිමුඛය වචනය දෙවැනි කර සලකන වටපිටාවක් දක්නට ලැබේ. බොහෝ කිතුණුවන් සාතන්ගේ බීජය ඇති අය පිටු පස හඹා ගොස් අන්දමන්ද වී තම සාක්ෂිය නැති කරගන්න අවස්ථා උදා කරගෙන ඇත.

මේ අනුව කායින් සහ ආබෙල්ගෙන් නියෝජනය කරන වර්ග දෙකක දරුවන්ගේ ක්‍රියාදාමය ගමන් කරනුයේ කුමන දිශා ගතවද? එය කිතුණු ලෝකයේ පැවැත්මට අතිශයෙන් බලපායි. කිතුණුවාට කල හැකි යහපත් දේ අපමණය. කිතුණුවා සමාජය තුළ කැඩපතක් වීමට නිවැරදිව වචනයේ පැවතීමට අධිෂ්ඨාන කර ගත යුතු කරුණක් වන්නේය.

කථිකාචාර්ය පී. අසෝකා ජයලත්
නො: 81 කුරුප්පු මාවත.
වත්තල්පොල.
පානදුර.



# Wait & Watch

"උන්වහන්සේ සියලු දේම ඒ ඒ කාලයට සුදුසු ලෙස සලස්වා තිබේ." (දේශනාකාරයා 3:11)

බලා සිටීමට අප බොහෝ විට අකමැතිය. එය වෙහෙසකර බව බොහෝ දෙනෙකුගේ අදහසයි. එසේ නම්, **"ඇත්ත වශයෙන්ම බලා සිටීම දුෂ්කරද?"** යම් දෙයක් සඳහා අප තුළ ඇති දැඩි කුතුහලය සහ ආශාව අපව ඉක්මනින් වෙහෙසට පත්කරවන බව මනෝවිද්‍යාඥයන්ගේ අදහසයි. ඔවුන් පෙන්වා දෙන ආකාරයට ආශාව සහ කුතුහලය පුද්ගලයා තුළ ඇති වූ කල්හි එය ඉක්මනින් තෘප්ත කර ගැනීමටත් තමා සතු කර ගැනීමටත් පුද්ගල අභ්‍යන්තරයෙන් ප්‍රේරනයන් ක්‍රියාත්මක වේ. මෙලෙස පුද්ගලයා තම සිතැඟි ඉටුකර ගැනීමට සූදානම් මෙන්ම තමා අවට ඇති සමාජ, සංස්කෘතික, අධ්‍යාපන, ආර්ථික සහ ආගමික සාධක ඊට ප්‍රතිරෝධන බලවේග ලෙස නැගී සිට තවදුරටත් බලා සිටිය යුතු බවට පුද්ගල ශරීරයට එත්තු ගන්වයි. මෙය මානසික වශයෙන් මෙන්ම ශාරීරකව ද පීඩාකාරී බවක් ඇති කරයි. මෙසේ ගත් කළ **"බලා සිටීම" දුෂ්කර බව සත්‍යයකි.**

එසේ නම්, **"බලා සිටිය යුතුද?"** ඕනෑම පුද්ගලයෙක් සිය ජීවිත කාලය තුළ එක් වරක දී හෝ **යම් දෙයක් හෝ යම් කෙනෙක්** වෙනුවෙන් බලා සිට ඇත. බලා සිටීම බොහෝ විට අභියෝගාත්මක වන්නේ **යොවුන් වියේ ආදරය** සහ ඒ මත පැන නැගෙන **ලිංගිකත්වය** තුළයි. ඊට හේතුව යොවුන් වියේ සිතුවිලි ඉතා වේගයෙන් දෝලනය වීමයි. මෙහි ප්‍රතිඵලයන් ලෙස හැඟීම් මත පමණක් පදනම්ව තීරණ ගැනීම, එම තීරණ නිවැරදි යැයි සිතීම, නිදහසේ ජීවිතය විඳීමට විය යුතුය යන සිතුවිල්ලක් පැවතීම මේ අවධියේ තරුණ දරුවන් තුළ දැකගත හැකි පොදු ලක්ෂණයකි. මේවා කිසි විටෙකත් අසාමාන්‍ය නොවේ. නමුත් පැහැදිලිවම තම අනාගත සැලසුම් සඳහා අවාසිදායක වේ. යොවුන් වියේ ආදරය සහ ලිංගිකත්වය පිළිබඳ හැඟීම් පොදුවීම **ස්වභාවිකවම සිදුවන්නකි. එය සිදුවිය යුතු දෙයකි.** එසේ වුවත් ඒ තුළ යම් පාලනයක් නම් තිබිය යුතුමය. පාලනයක් තබා ගැනිම යනු නිදහස සීමා කිරීමක් නොවන බව අප තේරුම් ගත යුතුයි. පාලනය වීම යනු අපේ ආරක්ෂාව වෙනුවෙන් අප කරන ආයෝජනයකි.

### ➢ පාලනය වීම ආයෝජනයක් වන්නේ කෙසේද?

අතීත සම්බන්ධයන්හී මිෂනාරී අත්දැකීම් සහ චිත්ත වේගයන්ගෙන් තොරවූ මනසක් සහිතව අනාගත සහකරු සමඟ විනෝද විය හැකි වීම, ඔබේ අනාගත සබඳතාවන් විශ්වාසය මත ගොඩනැගිය හැකි වීම, ඔබට දෝෂාරෝපණ සහ කැළැල් නොමැති වර්තමානයක් හිමිවීම, ලිංගික රෝග සහ හදිසි ගැබ් ගැනීම් පිළිබඳව අනියත බියක් ඇති නොවීම, ඔබට ආදරය සහ කාමය වෙන් කර හඳුනා ගැනීමට බැවින් ශාරීරකව මෙන්ම අධ්‍යාත්මිකව ද අනාගත සහකරු සමඟ බැඳී සිටීමට හැකි විමයි. මේ හරහා අවබෝධ කර ගත යුත්තේ බලා සිටිය යුතු බවයි. මන්ද එය ක්‍රියාවට නැගීම දුෂ්කර වුව ද සැබවින්ම ඔබට වාසිදායක වේ.

### ➢ බලා සිටීම හෙවත් පාලනය වීම ක්‍රියාවට නංවන්නේ කෙසේද?

බලා සිටීම සහ පාලනය වීම දුෂ්කර බැවින් ඒ සඳහා පුරුදු පුහුණුවීම අත්‍යාවශ්‍යය වේ. පුරුදු පුහුණු විය යුත්තේ ඔබගේ ශරීරය සහ සිතුවිලි දමනය කර ගැනීම සඳහායි. මේ සඳහා පළමුකොට **ඔබට ඔබව පාලනය කර ගත හැකි බව විශ්වාස කරන්න**, දෙවනුව **ඔබව පරීක්ෂාවන්ට භාජනය කරන්නාවූ දේ වලින් ඉවත් වන්න. එවා මග හරින්න.** (ඇතැම් මිතුරන්, මුහුණු පොත(fb), හදම එමග‍ෘ ඩසාදි චිත්‍රපට (අසභ්‍ය හෝ ඔබේ වයසට නොගැලපෙන) තෙවනුව **අවශ්‍යතාවය තිබූ පමණින් ඔබටද අත්‍යාවශ්‍ය යැයි නොසිතන්න. මක්නිසාද ඕනෑම දෙයක් රසවත් වන්නේ නිසි ප්‍රස්ථාවේදී ලැබුනහොත් පමණි.**

ආදරණීය තරුණ, තරුණියනි, පවිත්‍රත්වය සහ නිකැළැල් බව දෙවිඳුන් ඉදිරියේ ප්‍රසන්න වෙන අතර සැමවිටම ඔබේ පාලනය සහ බලා සිටීමට දේව මගපෙන්වීම ලැබේ. එයට කීකරුවීම හෝ නොවීම සැමවිටම ඔබගේ තෝරා ගැනීමකි. කීකරුවීම තුළින් දේව ආශිර්වාදය ඔබ වෙත ගලා එන්නා සේම එය ඔබගේ නිදහස බාධාවක් නොවන බව මතක තබා ගනිමු.



චාමි නන්දුපා.
මනෝ විද්‍යා විශේෂවේදී - කැළණි විශ්ව විද්‍යාලය.
(ක්‍රිස්තියානි රෙපරමාදු දේවස්ථානය - ගාල්ල)

## ආදරණීය දුවේ පුතේ,

නෝවාගේ කාලයේ ඇති වූ මහා ජල ගැලීමෙන් දුෂ්ඨවූ මිනිසුන් විනාශ වූ බවත්, ධර්මිෂ්ඨව ජීවත් වූ නෝවා ඇතුළු පවුලේ සැම දෙවියන්වහන්සේ බේරා ගත් අයුරුත් පසුගිය කලාපයෙන් ඉගෙන ගත්තා ඔබට මතක ඇති.

අද අපි ශුද්ධ බයිබලයේ උත්පත්ති 12,17,21 හා 22 පරිච්ඡේදයන් වල සඳහන් වන
**ආබ්‍රහම්ගේ කතාව ඉගෙන ගනිමු.**

දවසක් දෙවියන්වහන්සේ ආබ්‍රහම් වෙතට පැමිණ, "ඌර් දේශය අත්හැර, මා නුඹට පෙන්වන කානාන් දේශයට යන්න" යයි කීසේක. ඊට කීකරු වූ ආබ්‍රහම් තම බිරිඳ වූ සාරා, තම සොහොයුරාගේ පුත් වූ ලොත් හා සේවකයින්ද කැටුව කානාන් දේශයට ගියේය. මෙසේ ආබ්‍රහම් දෙවියන්වහන්සේගේ හඬට කීකරු වූ නිසා උන්වහන්සේ ඔහුට බොහෝ සතුන්ගෙන්ද, වටිනා සම්පත් වලින්ද ආශිර්වාද කළ සේක. ආබ්‍රහම්ද දෙවියන්වහන්සේට පූජාසනයක් සාදා නමස්කාර කළේය.

එහෙත් ආබ්‍රහම් සහ ඔහුගේ බිරිඳ වූ සාරා බොහෝ වයස්ගත වනතුරුම තමන්ට දරුවෙකු නොලැබීම නිසා ඉතා වේදනාවෙන් කල්ගත කරන්නට විය. මෙලෙස ආබ්‍රහම් සිටින විට දිනක් දෙවියන්වහන්සේ ඔහුට කතා කොට ඔවුනට දරුවෙක් දෙන බවට පොරොන්දු වූ සේක. උන්වහන්සේ පැවසූ ආකාරයටම සාරා පුත්‍රයෙකු බිහි කළ අතර ඔහුට " ඊසාක් " කියා නම තැබීය. මෙලෙස ඊසාක් උපත ලබන විට ආබ්‍රහම්ට වයස අවුරුදු 100 ක්ද, සාරාට වයස අවුරුදු 90 ක්ද විය.

මෙසේ කල්ගතවත්ම තවත් දිනක් දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට කතා කරමින් " නුඹ ප්‍රේම කරන නුඹේ එකම පුත්වන ඊසාක් රැගෙන මොරියා දේශයට ගොස් දවන පූජාවක් ලෙස ඔප්පු කරන්න " යි කීසේක. ආබ්‍රහම් උදෙන්ම නැගිට අවශ්‍ය දෑ සූදානම් කරගෙන තවත් තරුණයන් දෙදෙනෙකු හා සමඟ ඊසාක්ද කැටුව ගමන් ආරම්භ කළේය. දින තුනක් ගමන් කළ පසු තම සගයින් අතරමඟ නවතා ඊසාක් සමඟ පූජාව සම්පූර්ණ කිරීමට ආබ්‍රහම් පිටත් විය. "ගින්දරත් දරත් තිබේ. එහෙත් දවන පූජාවට බැටළු පැටවා කොයින්ද ?" ඊසාක්ගේ පැණයට "දෙවියන්වහන්සේම එය සපයනවා ඇත" යි ආබ්‍රහම් පිළිතුරු දුන්නේය.

ඒ අයුරින්ම ආබ්‍රහම් තම පුත් වූ ඊසාක් පූජා කරන්නට යන අවස්ථාවේ දී "දරුවා පිට අත නොතබන්න" යයි පැවසූ දෙවියන්වහන්සේ බැටළුවෙකු සැපයූ සේක.



ආදරණීය දුවේ පුතේ, අපි දෙවියන්වහන්සේ පවසන දෙයට කීකරු විය යුතුයි. අපි එසේ කරන විට උන්වහන්සේ අපට ආශිර්වාද කරනවා. ඒ නිසා කෙතරම් අමාරු අවස්ථා වලදී වුවත් උන්වහන්සේට කීකරුවන්නට අදිටන් කර ගනිමු.

මිහිරි නැන්දා




මෙම රූපය තුල සැඟවුණු රූප සොයා සළකුණු කොට අප වෙත එවන්න.

සපත්තුව
සර්පයා
බිම්මල
දැල්ලා
ඔටුන්න

නම : ..........................................

වයස : ..........................................

උපන් දිනය : ..........................................

(පවතින වසංගත තත්වය හේතුවෙන් ඔබගේ පිළිතුරු වට්ස්ඇප් (whatsup) මගින් 0773952924 අංකය හරහා අප වෙත එවිය හැක.)

# පසුගිය කලාපයේ නිවැරදි පිළිතුරු..




# දෙවියන්වහන්සේ නොඉවසන්නාවූ කාරණා

බයිබලයේ එළිදරව් වන කිතුණුවන්ගේ දෙවියන්වහන්සේ කරුණාවෙන් පූර්ණ වූ දෙවියන්වහන්සේ වන සේක. නුමුත් උන්වහන්සේ අන්‍ය භක්ති නොඉවසන්නාවූ දෙවියන්වහන්සේය.

ඊශ්‍රායෙල් ජාතිය මිසරයේ ගෝෂෙන් පලාතේ සිට ඵාරාවෝගේ වහල්භාවයෙන් මුදාගෙන පොරොන්දු දේශය බලා පිටත්වීමේ ගමන ආරම්භ විය. නුමුත් මිසරයේ හමුදාව ඔවුන් លුහුබැඳ අවෝය. ඊශ්‍රායෙල් සෙනඟව ආරක්ෂා කොට මිදී යාමට මාර්ගයක් විවෘත කල දෙවියන්වහන්සේ ඔවුන්ව රතු මුහුද දෙබෑ කරමින් එගොඩ කළසේක. නුමුත් ඔවුන් හඹා ආ මිසරයේ හමුදාවන්ගේ අශ්වයන්ද, රථද, සෙබලුන්ද රතු මුහුදේ ගිලී මළෝය. එසේ පුදුම දේ දැක මිසරයෙන් මිදී ආ ඊශ්‍රායලිතයන් වැඩිකල් යන්නට මත්තෙන් විවිධ වූ දෙවිවරු නමස්කාර කිරීමට පෙළඹුණෝය. මෙය දුටු දෙවියන්වහන්සේ

උදහස්ව ඔවුන්ගේ කොටසක් පොරොන්දු දේශයට යාමට පෙර අතරමගදී විනාශ කලසේක. උන්වහන්සේ අන්‍ය භක්තිය නොඉවසන්නාවූ දෙවියන්වහන්සේය



දෙවියන්වහන්සේ උදය කාලයේ වලාකුළකින්ද, රාත්‍රී කාලයේදී ගිනි ටැඹකින්ද මෝසෙස් ඇතුළු ඊශ්‍රායෙල් සෙනඟට මගපෙන්වූ සේක. ඒවා ගමන් කළ විට ඔවුන්ද ගමන් කළෝය. ඒවා නැවතුන විට ඔවුන්ද නැවතුනෝය. මේ ආකාරයෙන් පොරොන්දු දේශයට යන ගමනේ දෙවියන්වහන්සේ විවිධ සතුරන්ගෙන් ඊශ්‍රායෙල් සෙනග ආරක්ෂා කරමින් ගෙනගිය සේක. නුමුත් ඇතැම් අවස්ථාවලදී ඇතැමුන් දෙවියන්වහන්සේ නොයන ලෙස දැනුම් දුන් ස්ථානවලට ගොස් ඔවුන්ගේ සතුරන්ගෙන් මැරුම් කෑවෝය. උන්වහන්සේද ඔවුන්ව සතුරන්ගේ අත්වලට පාවාදුන්සේක. උන්වහන්සේ අන්‍ය භක්තිය නොඉවසන්නාවූ දෙවියන්වහන්සේය.

දෙවියන්වහන්සේ ඔවුන් පොරොන්දු දේශයට රැගෙන යන අතරතුර ඔවුන්ට වඩා එවකට බලවත්ව සිටි බොහෝ ජාතීන් අතින් ඔවුන් මුදාගත් සේක. ඔවුන්ට ඉදිරියෙන් යමින් ඒ ජාතීන් උන්වහන්සේ පන්නා දැමූ සේක. නුමුත් ඔවුන් උන්වහන්සේ කී දේ විශ්වාස නොකළ නිසා සර්පයන් එවා ඔවුන්ව මරා දැමූ සේක. උන්වහන්සේ අන්‍ය භක්තිය නොඉවසන්නාවූ දෙවියන්වහන්සේය.

දෙවියන්වහන්සේ සෑම මනුෂ්‍යයා විසින්ම නමස්කාර කළයුතු වැඩසිටින්නාවූ එකම දෙවියන්වහන්සේය. එසේ වැඩ සිටින දෙවියන්වහන්සේගේ බලය හා මහිමය අප විසින් වටහාගත යුතුය. ඊශ්‍රායෙල් සෙනග පොරොන්දු දේශය වෙත බොහෝ හාස්කම් කරමින් රැගෙන ගිය තැනන්වහන්සේ අදහන්නාද ස්වර්ගය කරා ගෙනයන සේක. නුමුත් උන්වහන්සේව පමණක් අදහමින් උන්වහන්සේට පමණක් සේවය කරන බවට අප නිතර සිහිකර ගත යුතුය.

"මක්නිසාද නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේ වන
මම අන්‍ය භක්ති නොඉවසන්නාවූ, මට
වෛරවෙන්නන්ගේ තුන්වෙනි සතරවෙනි
පරම්පරාව කෙරෙහි පියවරුන්ගේ අධර්මිෂ්ඨකම
ගැන දරුවන්ට ප්‍රතිඵල දෙන්නාවූ, මට
ප්‍රේමකරමින් මාගේ ආඥා පවත්වන්නවුන්ගෙන්
පැවතෙන දහස් ගණන් පරම්පරා දක්වා දයාව
පෙන්වන්නාවූ දෙවිකෙනෙක්ය."

(නික්මයාම 20:5)

සහෝදර අනුරුද්ධ පෙරේරා




**"එබැවින් ස්වාමීන්වහන්සේම නුඹලාට ලකුණක් දෙනසේක. බලව, කන්‍යාව ගර්භණීව පුත්‍රයෙකු වදා, එම්මානුවෙල් යන නම ඔහුට තබන්නීය."**
**(යෙසායා 7 : 14)**

යෝසෙප් විසින් මරියා හට විවාහ බස් දී තිබුණි. නුමුත් ඒ අතර මරියා ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආනුභාවයෙන් ගැබ් ගත්තාය. එකල සමාජයට අනුව මරියා විසින් යෝසෙප් හට ද්‍රෝහී වූවා මෙන් ප්‍රතිරූපයක් ගොඩනැගීමේ අවධානමක් මරියා හට තිබෙන්නට ඇත. මෙය දත් යෝසෙප් ඇයව පීඩාවට පත් නොකර ඇයව රහසින් අතහැරීමට කල්පනා කළේය. එසේ ඔහු කල්පනා කරමින් සිටින අතර දෙවියන්වහන්සේගේ දූතයා පැමිණ "ඇයව සරණපාවා ගැනීමට බිය නොවන්න. මන්ද ඇය තුල පිළිසිඳ ඇති දරුවා ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොටගෙන පිළිසිඳ ඇත" යන්න අනාවරණය කළේය. පුරුෂයෙකු සමග කායික සම්බන්ධතාවක් නොපවත්වා මෙසේ ඇය ගර්භනී වූයේ කෙළෙසදැයි ඇය දේවදූතයාගෙන් ඇසූ විට ඔහුගේ පිළිතුරු මෙසේ විය.

දේවදූතයා ඈට උත්තර දෙමින්: "ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹ කෙරෙහි පැමිණෙන සේක, මහෝත්තමයාණන්ගේ ආනුභාවයද නුඹ වසාගන්නේය. ඒ නිසා උපදින්ට සිටින තැනැත්තේ ශුද්ධය, දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝ යයි කියනු ලබන සේක."

යේසුස්වහන්සේ එලෙස කන්‍යාවක් තුලින් උපත ලැබුවේ මනුෂ්‍යයා පාපයෙන් ගළවා ගන්නා පිණිසය. උන්වහන්සේ ඉපිද, පාපය රහිත ජීවිතයක් ගෙවා, මරණයෙන් අදහන්නාගේ පාපය තමන් වෙත ගෙන, මළවුන්ගෙන් නැගිටීම හරහා අදහන්නාට ගැළවීම දුන්සේක. ඒ ආකාරයෙන් යේසුස්වහන්සේ හට මරියා තුළ පිළිසිඳ ගැනීමට මැදිහත් වූ එම ආත්මයාණන්වහන්සේම අද දින පව්කාරයන්ට එම යේසුස්වහන්සේවම අදහා ගන්නා පිණිස අලුතින් ඉපදීමට මැදහත්කාරකම් කරන සේක. ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන නව උත්පාදනයක් ලබන පිණිස යේසුස්වහන්සේගේ ශුභාරංචිය අදහා ගන්න. උන්වහන්සේ ලැබූ උපතේ හේතුව වටහාගෙන සැබෑ ප්‍රීතිය භුක්ති විඳින්න. දෙවියන්වහන්වහන්සේගේ රාජ්‍යට ඇතුල් වෙන්න.


**"යේසුස්වහන්සේ උත්තරදෙමින්: සැබවක් සැබවක් නුඹට කියමි-යමෙක් අලුතෙන් නූපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යය දකින්ට නොහැකියයි ඔහුට කීසේක."**

**(යොහන් 3:3)**

**"මක්නිසාද නුඹලා කුණුවෙන්නාවූ බීජවලින් නොව දෙවියන්වහන්සේගේ ජීවමානවූ පවතින්නාවූ වචනය කරණකොටගෙන, කුණු නොවෙන්නාවූ බීජවලින් නැවත උත්පාදකරනු ලැබුවහුය."**

**(1 පේත්‍රුස් 1:23)**

සහෝදර රුවීන්ද්‍ර පෙරේරා



# දෙවියන්වහන්සේ, සවාධිපත්තිය හා පූර්ව නියමය

## හැඳින්වීම

දෙවියන්වනහන්සේ හා උන්වහන්සේගේ සත්තාව හෙවත් උන්වහන්සේගේ පැවැත්ම සම්බන්ධව අවබෝධයක් ලබාගැනීම පිණිස ශු:බයිබලය වෙතට අවතීර්ණ වීමට අපට සිදුවේ. එහෙත් සම්පූර්ණයෙන් එළිදරව් කොට දී ඇති කරුණු පමණක් දැන ගැනීමට, අවබෝධකර ගැනීමට අපට හැකියාව ලැබෙන්නේ අප ස්වර්ගයට පා තැබූ පසුවය.

දෙවියන්වහන්සේ සදාතනිකව පවතින වැඩවසන බව ශු: බයිබලය අපට උගන්වයි. **"පටන්ගැන්මෙහිදී දෙවියන්වහන්සේ අහසත් පොළොවත් මැවූ සේක"** (උත්පත්ති 1:1) යන වගන්තියෙන් ශු: බයිබලය එහි වාර්තාව ආරම්භ කරයි. එහෙත් උන්වහන්සේ ගැන කිසිවක් එහි වාර්තා නොවන අතර, විශ්වය මැවීමේදී උන්වහන්සේ විසින් සිදුකරණ ලද උන්වහන්සේගේ හස්ත කර්මාන්ත ගැන එයින් කරුණු ගෙන හැරපායි.

එහෙත් උන්වහන්සේ හා උන්වහන්සේගේ චරිත ගුණාංග, උන්වහන්සේගේ ලෝකය හා මිනිස් වර්ගයා සම්බන්ධව ඇති සදාතනික සැලැස්ම පිළිබඳව බයිබලය කරුණු දක්වයි. දින හයක් තුළ දෙවියන්වහන්සේ ලෝකයත් එහි ඇති සියල්ලත් මවා සත්වැනි දින නිවාඩු ගත් බව සඳහන් වේ. එහිදී අවසාන ලෙස මිනිසා මවා **"දෙවියන්වහන්සේ තමන් සෑදූ සියල්ලම දුටුසේක. බලව ඒ ඉතා යහපත්ව තිබුණේය"** (උත්පත්ති1:31) යනුවෙන් මැවිල්ලෙහි ක්‍රියාවලිය අවසන් කරයි. මෙසේ අවසන් වන්නේ දෘශ්‍යමානව පවතින සියල්ල සම්බන්ධ වන අතර, උන්වහන්සේ දිව්‍ය අනාගත සැලැස්මේ සම්පූර්ණ විස්තරය ශු:බයිබලය පුරාම විහිදී තිබේ.

## යහපත්ව තිබුනු මැවිල්ල අයහපත් භාවයට පත්වේ.

මනුෂ්‍යයා සාතන් හෙවත් යක්ෂයා විසින් පරීක්ෂා කරණු ලැබීම සහ පාපයට වැටීම සම්බන්ධව උත්පත්ති 3 පරිච්ඡේදය තවදුරටත් විස්තර කරයි. එහෙත් පාපයට වැටුණ මිනිසා අත් නොහැර ඔහු හට සදාතනික බලාපොරොත්තුවක් පිළියෙළ කොට තිබෙන බවද පරිච්ඡේදය තුළින්ම දෙවියන්වහන්සේ පැහැදිලි කර දුන්සේක. දෙවියන්වහන්සේ ප්‍රේමණීය දෙවිඳුන් බැවින් මිනිසාට මෙසේ බලාපොරොත්තුවක් ගෙන දුන්සේක. මෙය මිනිසා තම පාපයෙන් ගැලවෙන පිණිසත්, එයින් මිදීම ලැබ සම්පූර්ණ නිදහස ලබන පිණිසත් උන්වහන්සේ විසින් සදාතනයේ සිට පිළියෙල කරන ලද දිව්‍යය සැලැස්ම වේ.

**"වැරදුණු විට එය නිවැරදි කරණ ක්‍රම වේදයක් ගැන මිනිසා කල්පනා කරණු ලබයි."**

මෙය අපගේ ක්‍රමවේදයයි. එහෙත් දෙවියන්වහන්සේගේ ක්‍රමවේදය මෙයට වඩා හාස්පසින්ම වෙනස් වේ. උන්වහන්සේ සර්වඥ, සර්වව්‍යාපී හා සර්වබලධාරී තැනැන්වහන්සේ වන සේක. මිනිසාගේ වැටීම හා පාපය ලොවට අවතීර්ණ වී එය දුර්වර්ණ වන අයුරු විශ්වය මැවීමටත් පෙර උන්වහන්සේ දැන සිටි සේක. එබැවින් ඒ සඳහා අවශ්‍යය පිළියම හා සැළැස්ම උන්වහන්සේ පිළියෙළ කොට මිනිසා හට දිව්‍ය වචනය මගින් එළිදරව් කළ සේක.

## දෙවියන්වහන්සේගේ සර්වාධිපත්‍යය හා පෙරනියමය :

ත්‍රී එක නාමයෙන් වැඩ වසන දෙවියන්වහන්සේ මෙලෙස සදාතනික යාග පූජාව වන පිණිස යේසුස්වහන්සේද පිළියෙළ කොට තිබූ බව පේතෘස් තුමා අපට මතක් කර දෙයි. **"මක්නිසාද ඔබලාගේ පියවරුන්ගෙන් ලැබූ ඔබලාගේ නිෂ්ඵල හැසිරීමෙන් ඔබලා මුදනු ලැබුවේ රන් රිදී වැනිවූ දිරායන දේවල් කරණකොට ගෙන නොව, කැළලක්වත්, පලුද්දක්වත්, නැති බැටළු පැටවෙකුගේ ලේ වැනිවූ ක්‍රිස්තුස්වහන්සේගේ ආනර්ඝ ලෙය කරණකොට ගෙන බව ඔබලා දන්නහුය. ලෝකය මැවීමටත් පළමුවෙන් නියම කරණු ලැබූ උන්වහන්සේව මළවුන්ගෙන් නැගිටුවා උන්වහන්සේට මහිමය දුන්නාවූ දෙවියන්වහන්සේ කෙරෙහි උන්වහන්සේ කරණකොට ගෙන අදහන්නාවූ ඔබලා උදෙසා උන්වහන්සේ කාලවල කෙළවරදී ප්‍රකාශ කරණු ලැබූ සේක."** (1 පේතෘස් 1:18-21)

මෙය දෙවියන්වහන්සේගේ සදාතනික සැලැස්මයි. ඔබ යේසුස්වහන්සේව අදහන අනුගාමිකයෙකු නම් උන්වහන්සේට ස්තුති කරන්න. යේසුස් වහන්සේ ජීවිත පූජාව ඔබව සියළු පාප වලින් නිදහස් කොට සදාතනික බලාපොරොත්තුවක් ඔබට පිරිනමා තිබෙන බැවින් ස්තුතිවන්ත දිවියක් ගත කිරීමටත්, උන්වහන්සේට මෙහෙ කිරීමටත් ඔබ තීරණය කරන්න.

**යේසුස් වහන්සේ වදාළ උත්තම පූජක යැදුමෙන්ද මෙම සත්‍යය සනාථ කරයි. "ඔබවහන්සේ ලෝකයෙන් වෙන්කොට මට දුන් මිනිසුන් හට ඔබගේ නාමය මම ප්‍රකාශ කළෙමි."** (ශු: යොහන් 17:6,11,12 හා 24)

තවද **"අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පියවූ දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා.! මක්නිසාද උන්වහන්සේ ඉදිරිපිට ප්‍රේමයෙන් ශුද්ධව, නොකැළැල්ව සිටින පිණිස, ලෝකය මැවීමටත් ප්‍රථමයෙන් ක්‍රිස්තුස්වහන්සේ තුළ ස්වර්ගීය ස්ථානවල සියළු ආත්මික ආශීර්වාද වලින් උන්වහන්සේ අපට ආශීර්වාද කළසේක."** (එපීස 1:3-4) මිනිසා කෙරෙහි දෙවියන්වහන්සේගේ මනසෙහි පැවැති මෙම දිව්‍ය අභිරහස ශු:පාවුල් තුමා හටද උන්වහන්සේ එළිදරව් කර තිබීම ඉහත දක්වයි. ඔබ මොහොතකට එම වාක්‍ය කාණ්ඩය දෙස ගැඹුරෙන් අධ්‍යයනය

කොට සිතන්න. එය අතීත කාල වාක්‍යයක් වන අතර දෙවියන්වහන්සේ මිනිසාගේ ගැළවීම සම්බන්ධව සියල්ල පිළියෙල කොට සකස්කොට තිබීම එයින් පැහැදිලි වන බැවින් නැවතත්, අපි එක්ව දෙවියන්වහන්සේට ස්තුති පුදමු.

පාපයට වැටී බලාපොරොත්තුවක් නොමැතිව සිටි මිනිසා හට දෙවියන්වහන්සේ නොවෙනස් වන සදාතනික නියමයන් අනුව පූර්වයෙන් තීරණය වී ඇතැයි දක්වන න්‍යාය මෙයින් අදහස් කෙරේ. එය දේව කැමැත්ත අනුව විනා මිනිසාගේ හැකියාව හෝ පින් බලයක් නිසා ලැබෙන්නක් නොවේ. මෙය දෙවියන්වහන්සේගේ ප්‍රේමය අත්දැකීමෙන් උන්වහන්සේගේ අනුග්‍රාහික කරුණාව කරණකොට ගෙන පව්කාර මිනිසා හට ලැබෙන ත්‍යාගයකි. **"උන්වහන්සේ කලින් තෝරාගත් අය, ස්වකීය පුත්‍රයාණන්ගේ ස්වරූපයට සමාන වන පිණිස, කල්තියා වෙන්කර ගත් සේක. එසේ කළේ තමන්වහන්සේ පුත්‍රයාණන් බොහෝ සොහොයුරන් අතර, ජ්‍යේෂ්ඨයාණන් වන පිණිසය. එසේ කලින් තෝරාගත් අය උන්වහන්සේ කැඳවා ගත් සේක. කැඳවාගත් අය උන්වහන්සේ දේව සබඳතාවයට බඳවා ගත් සේක. දේව සබඳතාවයට පැමිණි අය උන්වහන්සේ මහිමයට පැණවූ සේක."** (රෝම 8:29-30)

මිනිස් දෘෂ්ඨි කෝණයෙන් බලන විට සමහර විට ඔබ මෙයට එකඟ නොවිය හැක. ඔබ තුල "පූර්ණ නියමය" ගැන ගැටළුද තිබිය හැකිය. එහෙත් සත්‍ය එය වේ. ලොව පුරා ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය ප්‍රකාශ වන අතර, ශුද්ධාත්මයාණන්වහන්සේ පව්කරුවා තුළ ක්‍රියා කරමින් කිතුණුවෙකු වන පිණිස පරිවර්තනය, හෙවත් සංවර්තනය සිදු කරයි. මෙසේ හැරීම ලැබීමට හැකියාව ලැබෙන්නේ, දේව නියමය පරිදි පූර්ව තෝරාගැනීමට ලක් වුවන් පමණි. ඔබ තවදුරටත් ගැළවීම ලැබ ඇත්නම් දෙවිඳුන් හට තිතු පුදන්න. මෙම සදාතනික බලාපොරොත්තුව විනාශවන්නන් හට ප්‍රකාශ කරන්න. පාවුළු තුමා තුළ තිබූ හදවත ඔබ තුළත් ඇති වේවා! **"මාගේ දරුවෙනි, ක්‍රිස්තුස්වහන්සේ ඔබලා තුළ සෑදෙන තුරු ඔබලා නිසා නැවත ප්‍රසව වේදනාව විඳිමි."** (ගලාති 4:19)

ගැළවීම ලබා සිටින්නෙකු තුළ තිබිය යුතු ආකල්පය එයයි. ක්‍රිස්තුස්වහන්සේ ඔබලා තුළ සෑදෙන තුරු ඉවසිල්ලෙන් (ප්‍රසව වේදනාව මෙන්) අප සිටිය යුතුය.

## ද්විත්ව පූර්ව නියමය හා අතීත වතිකාව :

මෙම න්‍යාය ආධිපතනවාදය (Ṡupralapsarianism) ලෙස ද හැඳින්විය හැකිය. ලෝකය මැවීමටත්, මිනිසා පාපයට වැටීමටත් පෙර සිට දෙවියන්වහන්සේ මනුෂ්‍යයන් කොටසක් ගැලවීම සඳහා තෝරා ගෙන, වරණය කොට :ැකැජඑ- ඇති බව මෙයින් අර්ථවත් කරයි. සමහරෙක් දෙවියන්වහන්සේගේ තීන්දු ප්‍රකාශණයක් (decree) අනුව උන්වහන්සේගේ අභිමුඛයේ සිටින්නේ නම්, තවත් කොටසක් සදාතනිකව දෙවියන්වහන්සේගේම තීන්දු ප්‍රකාශණයක් අනුව එම වරප්‍රසාදයෙන් වෙන්කර ඇත්තන් විය යුතුය. මෙම දිව්‍ය සත්‍යය පිළිබඳව අදහස් එළිකළ ප්‍රථම **දේවවේදියා වන්නේ ශා.ඔගස්ටින් (ක්‍රිස්තු වර්ෂ 354-430). තුමාය. ඔහු ඉදිරිපත් කළ කරුණු මෙසේය.**

1. ආදම්ට පසු සියළු දෙනාම පාපයේ ගිලීගොස් ඇත.
2. අනුග්‍රහයට පමණක් මිනිස් අභිමතයේ ඇදහිල්ල ස්ථාවර කළ හැක.
3. දේව අනුග්‍රහය වර්ධනය හෝ ප්‍රතික්ෂේප කළ නොහැක.
4. එය ලැබෙන්නේ තෝරාගත් ස්වල්පයකට පමණි.

පූර්වාංශීය අනුග්‍රහය : Prevenient Grace - ගැන **ශා. ඔගස්ටින් තුමාගේ** අදහස ක්‍රිස්තු වර්ෂ **529**, **ඔරෙන්ජ්හි** දෙවන සභා සම්මේලනයේදී සම්මත වීය.

රෙපරමාදු දේවවේදීන් බොහෝ දෙනෙක් ද්විත්ව පූර්ව නියමය පිළිබඳ අදහසක් ඉදිරිපත් කර ඇත. මෙම දර්ශණය **කැල්වින් තුමා (ක්‍රි.ව. 1509-6)** විසින් වර්ධනය කොට පැහැදිලි කළේය. මේ අනුව සදාතන ජීවිතය සමහරෙකුට පූර්ව නියමයෙන්ම ලැබෙන බවත්, තවත් කොටසකට ඒ අන්දමටම නොලැබෙන බවත් ඔහු කියා සිටියේය. එහෙත් **ආමේනියන් වාදීන්** විසින් කැල්වින් තුමාගේ ස්ථාවරය ප්‍රතිකෙෂ්ප කරණ ලදී. ඩොර්ට්හී සිනෝඩය (ක්‍රි.ව.1618-19) සහ **වෙස්මිනිස්ටර් ඇදහිලි** ප්‍රකාශය **(ක්‍රි.ව. 1646) කැල්වින් තුමාගේ** න්‍යාය සම්මත කරණ ලදී.

ඒ අනුව දෙවියන්වහන්සේගේ අභිමතය ක්‍රිස්තුස්වහන්සේ තුළ හෙළිදරව් වී ඇත. **උන්වහන්සේ තුළ සියල්ල තෝරාගෙන :ැකැජඑ- ඇත. මෙම නිගමනය අනුව පූර්ව නියමය විශ්වීය :මබසඩැරිකසිඑ- තත්වයකි.**

**"තවද දෙවියන්වහන්සේට ප්‍රේම කරන්නන්ට, එනම් උන්වහන්සේ අභිප්‍රාය ලෙස කැඳවනු ලැබුවන්ට, සියළු දේම යහපත පිණිස එකට ක්‍රියා කරණ බව අපි දනිමුව."**(රෝම 8:28)


**"දෙවියන්වහන්සේ තෝරාගනු ලැබුවන්ට වරද තබන්නේ කවුද? ධර්මිෂ්ඨ කරන්නේ දෙවියන්වහන්සේය. වරදට පත් කරන්නේ කවුරුන්ද ?"** (රෝම 8:33)

සර්ව බලධාරී දෙවියන්වහන්සේ පාපයට වැටුණාවූ මිනිසා කෙරෙහි ස්ථාපිත උන්වහන්සේගේ දිව්‍ය අභිරහස් මෙයයි. තෝරාගත්තවුන් හා ගැළවීමට පත්වන්නන් තීරණය කරනු ලබන්නේ උන්වහන්සේය. එබැවින් සියළු මනුෂ්‍යයන් හට පාප කමාව ක්‍රිස්තුස්වහන්සේ තුළ හා ගැළවීමේ ශුභාරංචිය අප එක්ව ප්‍රකාශ කරමු. ඔබට උන්වහන්සේගේ අනුග්‍රාහික කරුණාව ලැබේවා !

ගරු එස්. ඊ. ෆේබර්
දේවගැති තුමා.



# අපෝස්තුළුවරුන්ගේ ඇදහිලි ප්‍රකාශය



අපෝස්තුළුවරුන්ගේ ඇදහිලි ප්‍රකාශය යනු ගෝලීය වශයෙන් වඩාත්ම භාවිතා වන්නාවූ ඇදහිල්ල පිළිබඳ ප්‍රකාශයයි. සෑම කිතුණු සභාවක්ම පාහේ විශ්වාස කරන්නාවූ මෙම ඇදහිලි ප්‍රකාශය පිළිබඳව ඔබේ දැනුමට කරුණු ගෙන එන්නෙමි.

**1. මෙය අපෝස්තුළුවරුන් විසින් රචනා කරන ලද්දක් නොවන්නේය.**

මෙම අපෝස්තලික ඇදහිලි ප්‍රකාශය ක්‍රිස්තු වර්ෂ 140 න් පසුව ලියන ලද්දක් බව සාක්ෂි මත සොයාගෙන ඇත. කෙසේ වෙතත් මින් පැහැදිලි වන්නේ මෙම අපෝස්තලික ප්‍රකාශය අපෝස්තුළුවරුන්ගේ ජීව කාලයෙන් පසු ලියන ලද බවයි. එබැවින් මෙම ඇදහිලි ප්‍රකාශය සකස් කරන ලද්දේ මුල් සභාවේ කිතුණු නායකයන් විසින් යැයි පිළිගැනේ. ඒ අනුව මෙය එක් පුද්ගලයෙකුගේ ප්‍රකාශනයක් නොව සභාව තුළ සිටියාවූ මුල් සභා නායකයින් සමූහයකගේ එකතුවක් වන්නේය. නමුත් මෙම ලිපියට අපෝස්තලික යන වචනය ඇතුල් කරන ලද හේතුව වන්නේ අපෝස්තුළුවරුන්ගේ ඉගැන්වීම් පාදක කරගෙන මෙය රචනා කරන ලද නිසා වේ. මෙම ඇදහිලි ප්‍රකාශය එක් මනුෂ්‍යයෙකුගේ හෝ එක් යුගයක ඉපදීමක් නොවේ. එය මුල් ශත වර්ෂවලදී වැඩුණා වූ ප්‍රකාශනයකි. අප වර්තමානයේ භාවිතා කරන්නාවූ ඇදහිලි ප්‍රකාශය සඳහා වූ අවසාන එක් කිරීම ක්‍රිස්තු වර්ෂ 450 දී පමණ ඇතුළු වන්නට ඇතැයි මතධාරීන්ගේ මතය වේ" ඒ නිසා මෙම ඇදහිලි ප්‍රකාශය මුල් සභාව තුළ කාලාන්තරයක් තිස්සේ ගොඩනැගුණු විශ්වීය ප්‍රකාශනයකි"




**2. සභා ඉතිහාසය තුළ මෙය භාවිතා කර ඇත්තේ කුමක් සඳහාද ?**

තුන්වන සියවසේ මුල් භාගයේ දී ටර්ටුලියන් වැනි සභා පියවරුන් ඇදහිලි ප්‍රකාශය, බව්තීස්මය අපේක්ෂා කරන අයට ඉගැන්වීම පිණිස භාවිතා කර ඇත. එමෙන්ම බොහෝ ව්‍යාජ ඉගැන්වීම් වලින් කිතුණුවන් ආරක්ෂා කිරීම පිණිස ද තම ඇදහිල්ල නැතහොත් විශ්වාසය කුමක්දැයි යන්න සාරාංශ වශයෙන් මතකයේ රඳවා ගැනීම පිණිස මෙම ඇදහිලි ප්‍රකාශය නිරන්තරවම භාවිතා කර ඇත. එහි මුල්ම ලිඛිත ස්වරූපයෙන්, ඥාණවාදය ප්‍රතික්ෂේප කිරීමක් ලෙස පෙනේ.

දෙවන ශතවර්ෂයේ සභාවේ ඥානවාදී මිත්‍යාදෘෂ්ඨින් සුලභ වූ අතර අපෝස්තුළුවරුන්ගේ ඇදහිල්ලේ සෑම පේළියක්ම පාහේ ඥාණවාදී අදහස් ප්‍රතික්ෂේප කරයි. ඥාණවාදීන් විශ්වාස කලේ භෞතික විශ්වය නපුරු බැවින් දෙවියන් එය නිර්මාණය නොකල අතර දෙවියන්වහන්සේ මිනිස් ඉතිහාසයේ කිසි විටෙකත් මිනිසෙකු බවට පත් නොවනු ඇති බවයි"

**3. අපෝස්තුළුවරුන්ගේ ඇදහිලි ප්‍රකාශය ප්‍රධාන වශයෙන් කොටස් තුනකින් යුක්තය.**


එනම් පළමු කොටස ලෙස දෙවියන්වහන්සේ සහ මැවීම ද, දෙවනුව පුත්‍රවූ දෙවියන්වහන්සේ සහ අපගේ මුදා ගැනීම ද, තෙවන කොටස ලෙස ශුද්ධාත්මවූ දෙවියන්වහන්සේ සහ අපගේ ශුද්ධකම යනුවෙනි"

**4. අපෝස්තලික ඇදහිලි ප්‍රකාශය.**

වගන්ති 12 කින් සමන්විත රෙපරමාදු සභාව විශ්වාස කරන්නාවූ අපෝස්තලික ඇදහිලි ප්‍රකාශය මෙයාකාරය.

**ස්වර්ගයේ ද පෘථිවියේ ද මැවුම්කාර වූ සියළු බල ඇති පිය වූ දෙවියන් අදහමි. උන්වහන්සේගේ ඒකජාතක පුත්‍රවූ අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ද අදහමි. උන්වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන් පිළිසිඳ, මරියා නම් කන්‍යාවකගෙන් ඉපිද, පොන්තියුස් පිලාත් යටතේ වද විඳ,**

කුරුසියේ ඇණ ගසනු ලැබ, මැරී තැන්පත් කරනු ලැබ, ආත්ම නිවාසයට බැස, තුන්වන දින මළවුන්ගෙන් නැගිට, ස්වර්ගයට නැගී, සියලු බල ඇති පියවූ දෙවියන්වහන්සේගේ දකුණු භාගයේහි වැඩ හිඳින බව ද, ජීවත් වන්නවුන් හා මළවුන් විනිශ්චය කරන පිණිස එතනින් එන බව ද අදහමි. ශුද්ධාත්මයාණන්වහන්සේ ද අදහමි. ශුද්ධවූ කතෝලික සභාවද, ශුද්ධවන්තයන්ගේ සහභාගිකම ද, පාප සමාව ද, ශරීරයාගේ නැවත නැගිටීම ද, සදාකාල ජීවනය ද ඇති බව අදහමි. "ආමෙන්"


Apostles' Creed

I believe in God the Father Almighty, Creator of heaven and earth; and in Jesus Christ, His Only Son, our Lord, Who was conceived by the Holy Spirit, born of the Virgin Mary, suffered under Pontius Pilate, was crucified, died, and was buried.
He descended into hell; the third day He rose again from the dead.
He ascended into heaven, sitteth at the right hand of God, the Father Almighty. From thence He shall come to judge the living and the dead.
I believe in the Holy Spirit, the Holy Catholic Church, the communion of Saints, the forgiveness of sins, the resurrection of the body, and life everlasting.
Amen.

මෙම වගන්ති ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදා ඇත. පළමුවැන්න පියවූ දෙවියන්වහන්සේ සහ අපගේ මැවිල්ල ගැන ය. දෙවැන්න පුත්‍රවූ දෙවියන්වහන්සේ සහ අපගේ මිදීම ගැන ය. තුන්වැන්න ශුද්ධාත්ම දෙවියන්වහන්සේ සහ අපගේ පවිත්‍ර කිරීම ගැනය.

මෙහිදී එකම දෙවි කෙනෙකු පමණක් සිටින බව විශ්වාස කරන කිතුණු අප වෙන් වන්නේ පවතින්නාවූ පුද්ගල තැනැන්වහන්සේලා තුන් දෙනෙකු ගැන කතා කරනු ලබන අතර, එය ත්‍රි එක දෙවියන්වහන්සේ ලෙස නැතහොත් ත්‍රිත්වය ලෙස නම් කරනු ලැබේ. මෙසේ වෙන් වෙන්ව පවතින්නාවූ තිදෙනා එකම සැබෑ සදාකාලික දෙවියන්වහන්සේ ලෙස උන්වහන්සේ තමන්වහන්සේව උන්වහන්සේගේ වචනය තුළ එළිදරව් කර ඇත.

"එම්බා ඉශ්‍රායෙල්, අසාපන්න. අපේ දෙවිවූ ස්වාමීන්වහන්සේ එකම ස්වාමීන්වහන්සේය."
(ද්විතීය කථාව 6:4)

"ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාවද දෙවියන්වහන්සේගේ ප්‍රේමයද ශුද්ධාත්මයාණන්වහන්සේගේ සහභාගිකමද නුඹලා සියල්ලන් හා සමග වේවා."

(2 කොරින්ති 13:14)

## ස්වර්ගයේද පෘථිවියේද මැවුම්කාර වූ සියළු බල ඇති පියවූ දෙවියන් අදහමි.

මින් අදහස් කරනු ලබන්නේ කිසිවෙකුගේ උපකාරයක් හෝ කිසිවක් උපයෝගී කර නොගෙන මේ මුළු මහත් විශ්වයෙහිම පවතින්නාවූ සියල්ල උන්වහන්සේ විසින්ම තම කැමැත්තෙන් හා සැලැස්ම පරිදි මැවූ බවත් **"කුමක් හෙයින්ද ස්වාමින්වහන්සේ අහසත් පොළොවත් මුහුදත් එහි ඇත්තාවූ සියල්ලත් සදවසින් සාදා සත්වෙනි දවසෙහි නිවාඩු ගත්සේක. එහෙයින් ස්වාමින්වහන්සේ සබත් දවසට ආශීර්වාදකොට එය විශුද්ධ කළසේක." (නික්මයාම 20:11)** එය අදටත් උන්වහන්සේ උසුලමින් පාලනය කරන්නා වූ බවත්ය. **"ගේ කුරුල්ලන් දෙදෙනෙකු සතයකට නොවිකුණද්ද? එහෙත් උන්ගෙන් එකෙක්වත් නුඹලාගේ පියාණන්වහන්සේ නොදැනුවත්ව බිම වැටෙන්නේ නැත." (මතෙව් 10:29)**

එමෙන්ම අප ස්වාමිවූ යේසුස්වහන්සේගේ සදාකාලික පියාණන්වහන්සේ මාගේ දෙවියන්වහන්සේ සහ පියාණන්වහන්සේ බවත්ය. තවදුරටත් මාගේ භෞතික හා ආත්මික අවශ්‍යතා උන්වහන්සේ සපයන බවත් **"නුඹේ බර ස්වාමීන් පිට තබව, උන්වහන්සේ නුඹ උසුලන සේක. උන්වහන්සේ කිසිකලෙකත් ධර්මිෂ්ඨයා සෙලවෙන්ට නොදෙන සේක." (ගීතාවලිය 55:22)** මේ දුක්ඛිත ජීවිතය තුළ මා කුමන තත්වයකට පැමිණියත් එය මාගේ යහපතට හරවන්නට උන්වහන්සේට හැකි බවත් **"තවද දෙවියන්වහන්සේට ප්‍රේම කරන්නන්ට, එනම් උන්වහන්සේගේ අභිප්‍රාය ලෙස කැඳවනු ලැබුවන්ට, සියලු දේම යහපත පිණිස එකට ක්‍රියාකරන බව අපි දනිමුව." (රෝම 8:28)** උන්වහන්සේ කෙරෙහි කිසිඳු සැකයක් නොමැති තරමට උන්වහන්සේ කෙරෙහි පරිපූර්ණව විශ්වාසය මා තබන බවත්ය. උන්වහන්සේ විශ්වාසවන්ත වූ පියාණන් කෙනෙකු ලෙස උන්වහන්සේ ද එසේ කිරීමට

කැමතිය. " **මක්නිසාද මේ සියල්ල අන්‍ය ජාතීහු සොයති. මේ සියල්ල නුඹලාට ඕනෑ බව නුඹලාගේ ස්වර්ගීය පියාණන්වහන්සේ දන්නා සේක. නුමුත් පළමුකොට උන්වහන්සේගේ රාජ්‍යයද උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමද සොයාපල්ලා: මේ සියල්ලත් නුඹලාට දෙනු ලබන්නේය."** (මතෙව් 6:32-33)

## උන්වහන්සේගේ ඒකජාතක පුත්‍රවූ අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ද අදහමි.

මෙයින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ එනම් දෙවියන්වහන්සේගේ සදාකාලික සහ ඒකජාතක පුත්‍රයාණන් බවද සාදන ලද හෝ මවනා ලද නොවන මුත් එහෙත් උන්වහන්සේ ම සම්පූර්ණ දෙවියන්වහන්සේ වන බව ද ඒත්තු ගනිමි. " **මක්නිසාද උන්වහන්සේ තුළ දේවත්වයේ සියලු සම්පූර්ණකම ශරීරාකාරයෙන් වාසය කරන්නේය."** (කොලොස්සි 2:9) මෙහිදී අපගේ ස්වාමීන්වහන්සේ යැයි ක්‍රිස්තුස්වහන්සේ අමතනු ලබන්නේ රන් හෝ රිදී වලින් නොව උන්වහන්සේගේ අනර්ඝ ලෙයින් අපගේ සියලු පාප වලින් මුදවා ඇත. **"මක්නිසාද නුඹලාගේ පියවරුන්ගෙන් ලැබු නුඹලාගේ නිෂ්ඵල හැසිරීමෙන් නුඹලා මුදනා ලැබුවේ රන් රිදී වැනිවු දිරායන දේවල් කරණකොට ගෙන නොව, කැලලක්වත් පළුද්දක්වත් නැති බැටළු පැටවෙකුගේ ලේ වැනිවු ක්‍රිස්තුස්වහන්සේගේ අනර්ඝ ලෙය කරණකොටගෙන බව නුඹලා දන්නහුය."** (1 පේතෲස් 1:18-19) අප උන්වහන්සේගේම වන පිණිස අපව යක්ෂයාගේ සියලුම බලයෙන්ද නිදහස් කරගෙන ඇත. **"පියාණන්වහන්සේ අන්ධකාරයේ බලයෙන් අප මුදා, තමන් ප්‍රේමයේ පුත්‍රයාණන්ගේ රාජ්‍යයට අප පමුණුවා ගත්සේක. උන්වහන්සේ තුළ අපගේ මිදීම වන, පව්වලට කමාව අපට තිබේ."** (කොලොස්සි 1:13-14) උන්වහන්සේ අපගේ සියලු පව්වලින් අප මුදා ගත් හෙයින් ද සාතන්ගේ බලයෙන් අප ගලවා ගත් හෙයින්ද ස්වකීය උරුමයක් කොට අපව සෑදු හෙයින්ද යේසුස්වහන්සේ අපේ ස්වාමීන්වහන්සේ වන සේක.

## උන්වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන් පිළිසිඳ මරියා නම් කන්‍යාවකගෙන් ඉපිද,

උන්වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන් පිළිසිඳ ගැනීම අර්ථවත් කරනුයේ දෙවියන්වහන්සේගේ සදාකාලික පුත්‍රයාණන් වන සැබෑ සහ සදාකාලික දෙවියන්වහන්සේ වන **"පටන්ගැන්මෙහිදි වාක්‍යයාණෝ සිටිසේක. වාක්‍යයාණෝ දෙවියන්වහන්සේ හා සමග සිටිසේක, වාක්‍යයාණෝ දෙවියන්වහන්සේව සිටිසේක."** (යොහන් 1:1) සහ එලෙස සිටින උන්වහන්සේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ ක්‍රියාත්මක වීම තුළින්ම කන්‍යා මරිය තුමියගේ මාංශයෙන් සැබෑ මිනිස් රූපය තමන්ට ගත් බවය. **"දේවදූතයා ඇට උත්තර දෙමින්: ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹ කෙරෙහි පැමිණෙන සේක. මහෝත්තමයාණන්ගේ ආනුභාවයද නුඹ වසාගන්නේය. ඒ නිසා උපදින්ට සිටින තැනැත්තේ ශුද්ධය, දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝයයි කියනු ලබන සේක."** (ලූක් 1:35) යේසුස්වහන්සේ දාවිත්ගෙන් සැබෑවටම පැවතෙන්නෙක් ද වන **"ඒ පුත්‍රයාණන්වහන්සේ මාංසාකාරයෙන් දාවිත්ගේ වංශයෙන් ඉපිද, ශුද්ධකමේ ආත්මයේ ප්‍රකාරයට දේව පුත්‍රයාණන් හැටියට මළවුන්ගෙන් නැගිටීම කරණකොටගෙන බලයෙන් යුක්තව ප්‍රකාශ කරනු ලැබුසේක."** (රෝම 1:5) පාපය නොමැතිවීම හැර සියල්ලේදී උන්වහන්සේ තම සහෝදරයන් වන අප වාගේ ම සිටී, "

**මක්නිසාද අපට සිටින්නේ අපේ දුර්වලකම් වලදී අපේ දුක නොදැනෙන උත්තම පූජකයෙක් නොව, පව් කිරීමක් නැතිව, සියලු ආකාරයෙන්ම අප වාගේ පරීක්ෂා කරනු ලැබු උත්තම පූජකයෙක්ය."** (හෙබ්‍රෙව් 4:15)

යේසුස්වහන්සේගේ පිළිසිඳ ගැනීම ශුද්ධාත්මයාණන් පිළිබඳ කාර්යයක් වුයේය. මෙය අපගේ තේරුම් ගැනීමේ බලය ඉක්මවු අනුග්‍රහයෙන් ආශ්චර්යයකි. මෙහි පැහැදිලි සත්‍යය වනුයේ ගැලවීම දෙවියන්වහන්සේගෙන්ම වන බවය. ක්‍රිස්තුස්වහන්සේගේ උත්පත්තියේදී දෙවියන්වහන්සේ මනුෂ්‍යයා වෙතට පහත් වනසේක.

එමෙන්ම මෙහිදී ඉතා වැදගත් කාරණයක් වනුයේ දෙවියන්වහන්සේගේ සදාකාලික පුත්‍රයාණන්වහන්සේ මනුෂ්‍යයා වු කල්හි උන්වහන්සේ දෙවියන් වීම නිම නොකළ සේක, උන්වහන්සේ දිව්‍ය ස්වභාවය සමග තවම දිව්‍ය පුද්ගලයන් සහ ත්‍රිත්වයේ දෙවෙනි පුද්ගලයන්ව සිටී. එහෙත් දැන් දිව්‍ය පුද්ගලයන් කෙරෙහි මනුෂ්‍ය සහ දිව්‍ය ස්වභාවය එකතු වීමට සිදු වන්නේය. උන්වහන්සේ දිව්‍ය තේජස පසෙක තබා දාසයකුගේ ආකාරය ගත් බව සත්‍යයකි. නමුත් උන්වහන්සේ නිතරම සැබෑවු දෙවියන්වහන්සේ වන සේක.

ගරු ඇන්ඩෲ වික්‍රමසිංහ සභාපාලක තුමා.
ක්‍රිස්තියානි රෙපරමාදු දේවස්ථානය
මාතර

# සභා පුවත්



ජනක ඩයස් සහ දුෂ්‍යන්ති කුලසේන යන අයගේ
අලානා එලයිෂා ඩයස් දියණිය
බම්බලපිටිය දේවස්ථානයේදී බෞතීස්මය ලැබීම



අන්තර් නිකායික බයිබල් දැනුම මිනුම තරඟාවලියෙන්
ප්‍රථම ස්ථානය හිමි කර ගත්
ආඳුරුප්පුව්දිය කාන්තා සංගමය



යොහාන් වීරසිංහ සහ සචින්තනා වීරසිංහ යන අයගේ
දුනන්ෂ්‍ය දියණිය
මාකඳුර දේවස්ථානයේදී බෞතීස්ම ලැබීම.





මාර්තු මස 04 වන දින
බම්බලපිටිය දේවස්ථානයේදී පැවැත්වූ
එක්සත් ලෝක යාච්ඤා දිනය

ගරු අමල් රෝයි ඇල්පිටිය,
ගරු ඇන්ඩෲ කොට්ලින්
සහ ගරු සුමිත් ප්‍රනාන්දු
යන සභාපාලකවරුන්
සහකාර දේවගැතිවරුන්
ලෙස ආලේප ලැබීම.














කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ දී
ගරු අමල් රෝයි ඇල්පිටිය,
ඇන්ඩෲ කොට්ලින්, සුමිත් ප්‍රනාන්දු
සහ ධනරාජ් අජේන්ද්‍රන් යන
සභාපාලකවරුන් දේව ධර්මය පිළිබඳ
උපාධිය ලබා ගැනීම.



විරාද් උදයංග සහ ඩිනා නදීශානි යන අයගේ
හේරුප්පගේ බෙලා ජූන් අයිරිස් දියණිය සහ
අසංක කුමාර රත්නායක සහ චම්පිකා දිල්හානි යන අයගේ
ජෙහාන් රුවල් රත්නායක පුත් ගාල්ල දේවස්ථානයේදී බෞතීස්මය ලැබීම.









පෙබරවාරි 4 වන දින පැවැත්වූ
ආදුරුප්පුවීදිය, මාකදුර, කොහුවල හා බම්බලපිටිය
එක්සත් නිදහස් දින දේව මෙහෙයන්

කොළඹ 06, ගාලු පාරේ, නො.363 හි පිහිටි ක්‍රිස්තියානි රෙපරමාදු සභාව වෙනුවෙන් චමින්ද රත්නායක සභාපාලකතුමා විසින් සංස්කරණය කර,
නො.119, ගංගොඩවිල, නුගේගොඩ, ඉම්ප්‍රේෂන්ස් මුද්‍රණාලයේ මුද්‍රණය කර, ක්‍රිස්තියානි රෙපරමාදු සභාව කොළඹදී ප්‍රසිද්ධ කරන ලදී.